

# ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම සම්බන්ධ නීතිය

## පිළිබඳ පුරවැසි අත්පොත

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
இலங்கை பத்திரிகை ஸ்தாபனம்
Sri Lanka Press Institute

# ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම සම්බන්ධ නීතිය පිළිබඳ පුරවැසි අත්පොත

**First published in Sri Lanka in October 2016**

© ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය

# ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම සම්බන්ධ නීතිය පිළිබඳ පුරවැසි අත්පොත

සම්පාදනය කළේ :
මේනකා ලේකම්වසම්

Design and Layout :
Nilantha Manjula

Illustrations :
Namal Amarasinghe

Printed by :
Design Systems (Pvt) Ltd.

**Project funded by :**
Office of Public Diplomacy,
The United States Embassy,
Sri Lanka.

**Project coordination by:**
The Sri Lanka Press Institute (SLPI)
96, Kirula Road, Colombo – 05,
Sri Lanka.
T : +94-11-5353635
Fax : +94-11-5335500
E : info@slpi.lk W: www.slpi.lk

**Recommended citation:**
Sri Lanka Press Institute (2016).
A Citizen's Manual on
Sri Lanka's Right to Information Law

ISBN 978-955-1734-08-4

Disclaimer : The author will be responsible for the choice and the presentation of the facts contained in the book and for the opinions expressed therein, which will not be necessarily those of SLPI and do not commit the organization. The designations employed and the presentation of material throughout this book will not imply the expression of any opinion whatsoever on the part of SLPI concerning the delimitation of its frontiers and boundaries.

# ABOUT THE SRI LANKA PRESS INSTITUTE

The Sri Lanka Press Institute (SLPI) is established by the Newspaper Society of Sri Lanka, The Editors' Guild of Sri Lanka, the Free Media Movement, and the Sri Lanka Working Journalist Association, to provide direction and leadership in media related activities. This includes the Press Complaints Commission of Sri Lanka (PCCSL), which encourages self-regulation and accountability and provides readers the right to challenge or correct reporting, while the Sri Lanka College of Journalism (SLCJ) is the training arm focusing on skills development for the journalistic profession. Overall, the mandate of the Sri Lanka Press Institute is to create a professional body of journalists which is responsible and accountable to the public.

The SLPI strives to maintain good governance, human rights, gender equity and poverty alleviation. It is a well-established fact that a diverse, professional and vibrant media can address these areas in a positive way, while a malfunctioning media does the opposite. The SLPI is a great believer in this argument. As such its advocacy to enact the Right to Information (RTI) has been from the inception of the Colombo Declaration in 1998, which was subsequently revisited in 2008. This project, funded by the United States Department of State, is one of the initiatives taken by SLPI in securing good governance and Freedom of Expression in Sri Lanka.

Board and Management of the Sri Lanka Press Institute (2016)

# පටුන

1වැනි පරිච්ඡේදය
**හැඳින්වීම** 6-9

2වැනි පරිච්ඡේදය
**තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම යනු කුමක් ද?** 10-12
1 (2), 1 (3), 4, 14 (ඉ), සහ 43 වගන්ති

3වැනි පරිච්ඡේදය
**අමාත්‍යවරුන්ගේ සහ පොදු අධිකාරීවල යුතුකම්** 13-15
7(1) සහ (2), 8, 10 සහ 30 වගන්ති

4වැනි පරිච්ඡේදය
**තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාපටිපාටිය** 16-24
7 (3), සහ (4), 9, 24-29, සහ 35 වගන්ති

5වැනි පරිච්ඡේදය
**තොරතුරු නිලධාරයේ සහ නම් කරන ලද නිලධරයෝ** 25-27
23 සහ 26 (1) වගන්ති

6වැනි පරිච්ඡේදය
**තොරතුරු ප්‍රතික්ෂේප කළ හැකි හේතු** 28-33
5, 6, 28, සහ 32 (4) වගන්ති

7වැනි පරිච්ඡේදය
**අභියාචනා** 34-39
31-34 වගන්ති

8වැනි පරිච්ඡේදය
**දඩුවම්** 40-43
38-40 වගන්ති

8වැනි පරිච්ඡේදය
**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව** 44-47
11, 12, 14-18, 37 සහ 39 වගන්ති

**ඇමුණුම**
RIGHT TO INFORMATION ACT NO. 12 OF 2016

# ක්ෂණික ප්‍රවේශය

## තොරතුරු සඳහා ඉල්ලීම්

ප්‍රවේශයේ ස්වභාවය සහ භාෂාව ඇතුළුව ඔබ ඉල්ලා සිටින නිශ්චිත තොරතුර හඳුනා ගැනීම සඳහා අවශ්‍ය සියලුම තොරතුරු ඉල්ලීමට ඇතුළත් විය යුතුය. ඔබ සම්බන්ධ කර ගත හැකි තොරතුරු හැරුණු විට වෙනත් පෞද්ගලික තොරතුරු ලබාදීම අවශ්‍ය නොවේ.

## පහසු ප්‍රවේශය

පොදු අධිකාරීන් විසින් නිශ්චිත කාල පරිච්ඡේදයක් ඇතුළත තොරතුරු වෙත පහසු හා ආරාවුල්වලින් තොර ප්‍රවේශයක් සඳහා පහසුකම් සැලසිය යුතුය. ඔබ විසින් තොරතුරු සඳහා ඉල්ලීමක් හෝ අභියාචනයක් භාරදීම අවශ්‍ය නොවේ.

## ප්‍රවේශ විය හැකි තොරතුරු

ප්‍රවේශය ලබාදුන් විට ඔබට අදාළ තොරතුරු අධීක්ෂණය කිරීමට; ලේඛන හෝ වාර්තාවල සටහන්, උද්ධෘත හෝ සහතික කළ පිටපත් ලබා ගැනීමට; අදාළ ද්‍රව්‍යයන්ගේ සහතික කළ නිදර්ශන ලබා ගැනීමට; ඩිස්කට්, ෆ්ලොපි, පටි, දෘෂ්‍ය කැසට්පට හෝ වෙනත් යම් විද්‍යුත් ක්‍රමයකින් හෝ මුද්‍රිත පිටපත් වශයෙන් තොරතුරු ලබා ගැනීමට හිමිකමක් ඇත්තේය.

## තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ඉල්ලීමක් සඳහා ගාස්තුව

තොරතුරු ඉල්ලන්නා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව නියම කරන ගාස්තු පිළිබඳ උපලේඛනයට අනුව ගෙවිය යුතුය.

## කොමිෂන් සභාව සම්බන්ධ කර ගැනීම

ඔබට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය නම් සෑම පොදු අධිකාරියකම පරිශ්‍රයේ හෝ වෙබ්අඩවිවල හොඳින් පෙනෙන ලෙස ප්‍රදර්ශනය කර ඇති සම්බන්ධවීමේ විස්තර අදාළ පොදු අධිකාරියෙන් ලබා ගත හැකිය.

## පොදු අනාවරණය

පොදු අනාවරණය පනතේ ප්‍රමුඛ මූලධර්මය වේ. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් සඳහා වූ සියලුම ව්‍යතිරේක පොදු යහපත සඳහා හෙළිදරව් කිරීමට යටත් වේ.

## පොදු අධිකාරීන්ගේ විෂයපථය

පනත යටතේ පොදු අධිකාරීන් යන්න ආණ්ඩුවේ ආයතනවලට සීමා නොවන අතර ඇතැම් සන්දර්භවලදී පෞද්ගලික හා රාජ්‍ය නොවන ආයතන ද ඇතුළත් වේ.

## ප්‍රගාමී හෙළිදරව් කිරීම

සියලුම පොදු අධිකාරීන් විසින් පනතේ මාර්ගෝපදේශවලට අනුකූලව තොරතුරු ප්‍රගාමී ලෙස හෙළිදරවු කළ යුතුය.

1 වැනි පරිච්ඡේදය

# හැඳින්වීම

## හැඳින්වීම*

*ඔබේ අවට ප්‍රදේශයට යන මාවත පිළිසකර කර දෙන මෙන් වසර ගණනාවක් පුරා පළාත් පාලන ආයතනයට ඉල්ලීම් කළ ද එය එසේ සිදු කර නොමැත. මාවත අළුත්වැඩියා කිරීමට වෙන් කළ මුදල්වලට සිදුවූයේ කුමක්දැයි දැන ගැනීමට ඔබට අයිතිවාසිකමක් තිබෙන බව ඔබ දන්නවා ද? එමෙන්ම ඔබේ දරුවා ළඟම පාසැලට ඇතුළත් කර නොගත්තේ ඇයි ද යන්න දැනගැනීමට ඔබට අයිතිවාසිකමක් තිබෙන බව ඔබ දන්නවා ද? එපමණක් නොව, ඔබේ ගමේ ජලය බෝතල් කිරීමේ යෙදෙන පෞද්ගලික සමාගමේ කොටස්වලින් අවම වශයෙන් සියයට විසිපහක් රජය සහ/හෝ රාජ්‍ය සංස්ථාවක් පාලනය කරනු ලබන්නේ නම් එම සමාගමේ පාරිසරික ආරක්ෂණ අනුකූලතා වාර්තාව ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කිරීමට ඔබට හැකි බව ඔබ දන්නවා ද?*

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය ජනතාවගේ පරමාධිපත්‍ය බලතල ක්‍රියාවට නංවන රජයේත් පොදු ජන ජීවිතයට බලපෑමක් සිදු කරන පෞද්ගලික ආයතන ඇතුළු පොදු අධිකාරීන්ගේත් විනිවිදභාවය හා වගවීම සහතික කිරීම වෙනුවෙන් ඉල්ලා සිටීම සඳහා පුරවැසියෝ බලගැන්වෙති. මෙමඟින් ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යවශ්‍ය අංගයක් වන පොදු ජන ජීවිතය සඳහා පුරවැසියන්ගේ පූර්ව ක්‍රියාකාරී හා අර්ථාන්විත සහභාගීත්වය ඉහළ නැංවෙයි.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම මෑතක් වන තෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නොපිළිගැනුණ ද ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙනත් කරුණු අතර භාෂණයේ හා අදහස් පළ කිරීමේ නිදහස පිළිබඳ අයිතිවාසිකම ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන විධිවිධාන අර්ථදැක්වීමේ ක්‍රියාවලියක් හරහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ව්‍යාංගාර්ථයෙන් පිළිගෙන ඇත.[1]

19වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පසුව, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව එහි 14අ ව්‍යවස්ථාව මඟින් හඳුනාගත් කිසියම් සීමාවලට යටත්ව තොරතුරු වෙත ප්‍රවේශවීමේ අයිතිවාසිකම තහවුරු කරනු ලැබේ. කෙසේවුව ද, තොරතුරු වෙත ප්‍රවේශවීමේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සීමා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළ හැකි හේතුවලට වඩා විෂයපථය අතින් පුළුල් වේ.[2]

---

*මෙම අත්පොත 2016 වසරේ ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ සම්පාදනය කරන ලදී. සම්පාදක මේ ව්‍යායාමයේ දී තමන් වෙත ලබාදුන් මඟපෙන්වීම වෙනුවෙන් ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ (SLPI) නියෝජ්‍ය සභාපති සිංහ රත්නතුංග මහතාට සහ කර්තෘ සංසදයේ නීති උපදේශක කිෂාලි පින්ටෝ-ජයවර්ධන මහත්මියට සිය කෘතඥතාව පළ කරයි.

[1] *විසුවලිංගම් එ. ලියනගේ (1984) 2 SLR 123, ප්‍රනාන්දු එ. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව (1996) 1 SLR 157, සීමාසහිත පාරිසරික පදනම එ. නාගරික සංවර්ධන අධිකාරිය (2005).*

[2] උදාහරණයක් ලෙස, (ජාතික ආරක්ෂාව, අධිකරණයට අපහාස කිරීම ආදී පොදු සීමාවන් හැරුණු කොට) සෞඛ්‍ය හෝ සදාචාරය ආරක්ෂා කිරීම, අන් අයගේ කීර්තිය හෝ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ද සඳහන් කර ඇත. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ නීතියේ එවැනි ප්‍රතික්ෂේප කළ හැකි පොදු හේතු නොමැත. ඒ වෙනුවට, හාරකාර සම්බන්ධතාවක් හෝ අපරාධයක් වැළැක්වීම සඳහා බරපතල අගතියක් පැවතීම ආදී පටු හේතු මත තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීම් ප්‍රතික්ෂේප කළ හැකිය. තව ද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ මුක්ත කළ තොරතුරු පවා පොදු මහජන සුභසිද්ධිය මත හෙළිදරව් කළ හැකිය.

කෙසේ වුව ද, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ආරක්ෂා කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන පමණක් ප්‍රමාණවත් නොවේ. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාපටිපාටි නිශ්චිතව දක්වමින් සහ ව්‍යතිරේක සඳහන් කරමින් ආයතනික ව්‍යුහයන් ඇති කරන නෛතික රාමුවක් සැපයීම අවශ්‍ය වේ. තව ද, රජයේ නිලධාරීන්ට ඔවුන්ගේ රාජකාරී ඉටු කිරීම සඳහා පරිපාලන මාර්ගෝපදේශ සකස් කිරීම ද අවශ්‍ය වේ.

2016 ජුනි මස 23වැනි දින ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව පුරවැසියන්ගේ තොරතුරු දැනගැනීමේ මූලික අයිතිවාසිකම අර්ථාන්විත කරමින්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්මත කෙළේය.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය සම්මත කර ගැනීම සඳහා වූ ශ්‍රී ලංකාවේ අරගලය දීර්ඝ කාලීන හා දුෂ්කර විය. 1995 වසරේ දී මාධ්‍ය නිදහසට සහ ප්‍රකාශනයේ නිදහසට බලපාන නීති ප්‍රතිසංස්කරණය සඳහා (එවකට පැවති රජයට) උපදෙස් දීම පිණිස ජ්‍යෙෂ්ඨ නීතිඥ වූ ආර්. කේ. ඩබ්ලිව්. ගුණසේකර මහතාගේ නායකත්වයෙන් යුත් කමිටුවක් පත් කරන ලදී, එම කමිටුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතක් කෙටුම්පත් කිරීමට නිර්දේශ කෙළේය. කමිටුවේ වාර්තාවට අනුව 1996 වසරේ දී ගරු. ඒ. ආර්. බී. අමරසිංහ විනිසුරුතුමා සභාපතීත්වය දැරූ ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත් කෙටුම්පතක් සකස් කෙළේය. 2000 වසරේ කෙටුම්පත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පතේ ද 'තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම' ඇතුළත් වුව ද එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව තුළ සම්මත නොවීය.

මේ අතර, ශ්‍රී ලංකා මුද්‍රිත මාධ්‍ය කර්මාන්තය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය රටේ ව්‍යවස්ථා පොතට ඇතුළත් කිරීම සඳහා ප්‍රබල ව්‍යාපාරයක් ආරම්භ කර තිබුණි. ශ්‍රී ලංකාවේ වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා පුවත්පත් සංගමය සහ ශ්‍රී ලංකා කර්තෘ සංසදය යන ආයතනවල මඟපෙන්වීම මත ඇති කර ගත් 1998 වසරේ මාධ්‍ය නිදහස සහ සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශනය සහ ඉන් පසුව 2008 වසරේ දී ඇති කර ගත් සංශෝධනය ද මඟින් ශ්‍රී ලංකාව තුළ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතියක අවශ්‍යතාව අවධාරණය කරන ලදී.

ඉන් පසුව, අගමැතිතුමාගේ කමිටුව[3] 2004 වසරේ තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ පනත් කෙටුම්පත සකස් කරන ලද අතර එය එවකට පැවති අමාත්‍ය මණ්ඩලය මඟින් අනුමත කිරීමෙන් පසුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එම පාර්ලිමේන්තුව කල් ඇතිව විසුරුවා හැරීමත් සමඟ පනත් කෙටුම්පත විවාදයට නොගැනිණි. 2010 වසරේ දී එවකට අධිකරණ අමාත්‍යතුමා ලෙස කටයුතු කළ මිලින්ද මොරගොඩ මහතාගේ මුල පිරීමක ප්‍රතිඵලයක් වශයෙන් මෙම පනත් කෙටුම්පත සංශෝධනය කරන ලදී. එළැඹුණු මහ මැතිවරණය හේතුවෙන් එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නොහැකි විය. 2011 වසරේ දී එවකට විපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ කරු ජයසූරිය මහතා

[3] අගමැති රනිල් වික්‍රමසිංහ මහතා සභාපති සහ බ්‍රැඩ්මන් වීරකෝන් මහතා ලේකම් ලෙස ද, සිංහ රත්නතුංග මහතා (එවකට කර්තෘ සංසදයේ සභාපති), වරුණ කරුණාතිලක මහතා (එවකට නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කැඳවුම්කරු), කිෂාලි පින්ටෝ-ජයවර්ධන මෙනෙවිය (එවකට කර්තෘ සංසදයේ උපදේශක), විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නියෝජනය කළ රොහාන් එදිරිසිංහ, සහ අසංග වැලිකල යන මහත්වරු යන අය එවකට නීතිපති වූ ජනාධිපති නීතිඥ කේ. සී. කමලසබේසන් මහතා, එවකට අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ධාරා විජේතිලක මහත්මිය සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සේවය කළ නැසී ගිය ශ්‍රියාංගනී ප්‍රනාන්දු මහත්මිය සමඟ එක්ව.

2004 වසරේ දී කෙටුම්පත් කළ තොරතුරු දැනගැනීමේ නිදහස පනත් කෙටුම්පත පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය. මෙම පනත් කෙටුම්පත ද පාර්ලිමේන්තුවේ විවාදයට නොගන්නා ලදී. පසුව, උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව 2011 වසරේ එහි අවසාන වාර්තාව තුළ රජය විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය හඳුන්වාදීම නිර්දේශ කර තිබූ අතර එය 2013 වසරේ එම කොමිෂන් සභාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ එක් ක්‍රියාකාරී ලක්ෂණයක් ලෙස ද ඇතුළත් කරන ලදී.

වර්තමාන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත වර්තමාන පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙ අනුග්‍රහය යටතේ 2004 වසරේ තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ පනත් කෙටුම්පතේ යාවත්කාලීන පිටපතක් මත පදනම් විය.[4] පනතේ ප්‍රකාශිත අරමුණ, තොරතුරු වෙත ප්‍රවේශවීමේ අයිතිවාසිකම ක්‍රියාවට නැංවීම තුළින් විනිවිදභාවය හා වගවීමේ සංස්කෘතියක් ඇති කිරීමත් එමගින් දූෂණයට විරුද්ධවීම සහ වගවීම හා යහ පාලනය ප්‍රවර්ධනය කිරීම හරහා ශ්‍රී ලංකාවේ ජනතාවට වඩාත් අර්ථාන්විතව පොදු ජන ජීවිතයට සහභාගීවීමේ හැකියාව ඇති සමාජයක් දිරිගැන්වීමත්ය. ජනමාධ්‍ය විෂය පැවරී ඇති අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වෙත පනත සක්‍රීය ලෙස බලාත්මක කිරීමේ වගකීම පවරා ඇත.[5]

නීතිය අවබෝධ කර ගැනීම සහ භාවිතා කිරීම සඳහා ප්‍රවේශය ඇති කිරීම වෙනුවෙන් පනතේ භාෂා තුනෙන්ම වූ පිටපත් ලබා ගැනීමට තිබෙන නමුත් සියලුම ව්‍යවස්ථා සම්බන්ධයෙන් පොදු කරුණක් වන පනතේ භාවිතා කර ඇති නෛතික භාෂාව හේතුවෙන් එහි අන්තර්ගතය සාමාන්‍ය පුද්ගලයන්ට පහසුවෙන් අවබෝධ කර ගැනීමට නොහැකිය. පනතේ අන්තර්ගතය අවබෝධ කර ගැනීමට ඇති මෙම බාධාව හේතුවෙන් පුරවැසියන්ට තමන්ගේ මූලික අයිතිවාසිකම් සහ රටේ යහ පාලනය සහතික කර ගැනීමෙන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකමේ පූර්ණ ප්‍රතිලාභ නෙළා ගැනීමේ හැකියාව අහිමි විය හැකිය.

එබැවින්, මෙම අත්පොත තුළින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ සියලුම කරුණු සරලව ඉදිරිපත් කිරීම හරහා පුරවැසියන්ට පනතේ අන්තර්ගතය පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් ලබා ගැනීමටත් පාලන ව්‍යුහ සමීපව අධීක්ෂණය කිරීම සඳහා එහි විධිවිධාන උපයෝජනය කර ගැනීමටත් රජය ජනතාවට වගකියන තත්ත්වය වර්ධනය කර ගැනීමටත් හැකි වනු ඇත. කෙසේවුව ද, මෙම අත්පොත පනතේ විධිවිධාන සඳහා මඟපෙන්වීමක් පමණක් බව සිහියේ තබා ගත යුතුය. අදාළ විධිවිධාන පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා ගැනීම සඳහා සෑමවිටම මෙම අත්පොත අවසානයේ අමුණා ඇති පනතේ විධිවිධාන වෙත යොමුවීමට අවශ්‍ය වනු ඇත.

[4] තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය සඳහා වූ අරගලය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ කාර්යභාරය සිංහ රත්නතුංග මහතා (නියෝජ්‍ය සභාපති), වරුණ කරුණාතිලක මහතා සහ කිෂාලි පින්ටෝ-ජයවර්ධන මහත්මිය විසින් 2015/2016 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය කෙටුම්පත් කිරීමේ කමිටුවට සහභාගීවීම ඔස්සේ අඛණ්ඩව සිදු කරන ලදී.

[5] 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 2වැනි වගන්තිය.

2වැනි පරිච්ඡේදය

# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම යනු කුමක් ද?

**2.1** පනතේ වැදගත්කම

**2.2** පනතේ ප්‍රමුඛ මූලධර්ම කිහිපයක්

**2.3** ප්‍රවේශ විය හැකි තොරතුරු

## 2.1 පනතේ වැදගත්කම

- රජයේ සහ රාජ්‍ය ආයතනවල තීරණ පුරවැසියන්ගේ ජීවිතවලට බලපෑම් කරයි.[6] එබැවින් පුරවැසියන් කෙරෙහි බලපෑමක් සිදු කරන තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඔවුන් කොටස්කරුවන් වීම අවශ්‍ය වේ.
- තමන්ට අදාළ රජයේ තීරණ දැනගැනීමට පුරවැසියන්ට අයිතියක් තිබේ.
- රජය, රාජ්‍ය ආයතන සහ පොදු ජන ජීවිතයට බලපෑමක් කරන පෞද්ගලික ආයතන පවා පුරවැසියන්ට පිළිතුරු දීමට බැඳී සිටී.
- පනත තුළින් පුරවැසියන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති ඔවුන්ගේ තොරතුරු දැනගැනීමේ මූලික අයිතිවාසිකම ක්‍රියාවට නැංවීමට පහසුකම් සලසයි.
- පනත මඟින් පොදු අධිකාරීන්ගෙන් තොරතුරු ලබා ගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාවලිය සහ යාන්ත්‍රණය දක්වයි.

## 2.2 පනතේ ප්‍රමුඛ මූලධර්ම කිහිපයක්

- **උපරිම හෙළිදරව් කිරීමේ මූලධර්මය** මඟින් තොරතුරු හැකිතාක් දුරට ප්‍රකාශයට පත් කිරීමට රජයට නියම කරනු ලැබේ.
- ඒ අනුව ඔවුන්ගේ සන්තකයේ ඇති නිල තොරතුරු ලබා ගැනීමට මහජනතාවට හැකි විය යුතුය.
- තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම යුක්තිසහගත කිරීමේ භාරය රජය සතු වේ.
- **ප්‍රගාමී හෙළිදරව් කිරීමේ මූලධර්මය.**[7] තොරතුරු වෙත ප්‍රවේශවීම සඳහා ගාස්තුවක් ගෙවීමට පුරවැසියන්ට අවශ්‍ය නොවන පරිදි පොදු අධිකාරීන්ගේ තොරතුරු සාමාන්‍ය කරුණක් ලෙස ප්‍රසිද්ධියට පැමිණවීම මෙයින් අදහස් වේ. ඒ අනුව තොරතුරු පහසුවෙන් ලබා ගැනීමේ හැකියාව ඇති වේ.
- **පළ කිරීමට බැඳීසිටීමේ මූලධර්මය**. පොදු අධිකාරියක් තොරතුරු ඉල්ලීම්වලට හුදු ප්‍රතිචාර දැක්වීමකින් තොරව මහජනතාවට වැදගත්කමක් ඇති තොරතුරු තමන් විසින්ම පළ කිරීම හා ව්‍යාප්ත කිරීම සිදු කළ යුතුය යන්න මෙයින් අදහස් වේ.
- **හෙළිදරව් කිරීම පූර්වගාමී වීමේ මූලධර්මය**. උපරිම හෙළිදරව් කිරීමේ මූලධර්මයට අනනුකූල වන සියලුම නීති තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට යටත් විය යුතු බව මෙමඟින් සහතික කරයි. පනත මේ සම්බන්ධයෙන් පනවා ඇති කිසිදු වෙනත් නීතියකට වඩා පූර්වගාමී වේ.[8]

[6] පුරවැසියන් යනු උපතින්ම හෝ ලියාපදිංචිය හරහා පුරවැසිභාවය ලැබූ තැනැත්තන් වේ. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ කාර්යයන් සඳහා සාමාජිකත්වයෙන් හතරෙන් තුනක් (3/4) පුරවැසියන්ගෙන් සැදුම්ලත් වන සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ ආයතනයක් ද මෙයට ඇතුලත් වේ. මෙම අර්ථකථනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 (1) ව්‍යවස්ථාවට සමාන වේ. This definition is similar to Section 121(1) of the Constitution.

[7] 14 (ඉ) වගන්තිය

[8] 4 වගන්තිය

## 2.3 ප්‍රවේශ විය හැකි තොරතුරු

- ප්‍රවේශ විය හැකි තොරතුරුවලට ඇතුළත් වන දේ; ඕනෑම භෞතික ස්වරූපයකින් ඇති සටහන්, ලේඛන, සංදේශ, විද්‍යුත් තැපැල්, මත, උපදේශ, මාධ්‍ය නිවේදන, චක්‍රලේඛ, නියම, ලොග් පොත්, ගිවිසුම්, වාර්තා, ප්‍රවෘත්ති පත්‍ර, සාම්පල්, ආදර්ශක, හුවමාරු වන ලිපි, සංදේශ, නීති කෙටුම්පත්, පොත්, පිඹුරු, සිතියම්, චිත්‍ර, රූපසටහන්, රූපමය හෝ ප්‍රස්තාරමය වැඩ හෝ ඡායාරූප, සේයාපට, ක්ෂුද්‍ර සේයාපට, ශබ්ද පටිගත කිරීම්, වීඩියෝ පට, යන්ත්‍ර මගින් කියවිය හැකි වාර්තා, පරිගණක වාර්තා සහ වෙනත් ලේඛනගත ද්‍රව්‍ය[9].
- මෙය මහජනතාවට සෘජුවම බලපාන සෞඛ්‍ය, අධ්‍යාපනය, පරිසරය ආදී ව්‍යාපෘති සම්බන්ධ ගැටලුවලට ද අදාළ විය හැකිය.
- එහෙත් මෙම අත්පොතේ 6වැනි පරිච්ජේදයේ විස්තරාත්මකව දක්වා ඇති ඇතැම් අවස්ථා යටතේ කිසියම් වර්ගවල තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ හැකිය.
- මෙම නීතිය යටතේ තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථාවලදී පවා එවැනි තොරතුරු ලබා ගැනීම සඳහා ද දොරටුව විවෘත කළ හැකි **මහජන සුභසිද්ධිය** නමැති අතික්‍රමණ සාධකයක් තිබෙන බව ද සැලකිල්ලට ගැනීම වැදගත් වේ.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ ඇතැම් විධිවිධාන[10] කථානායකතුමා පනත සහතික කළ දිනයේ සිට බලාත්මක විය.[11] තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම සහ තොරතුරු නිලධාරීන් පත් කිරීම මේවාට ඇතුළත් වේ. අනෙක් සියලුම විධිවිධාන පනත ක්‍රියාත්මක වී මාස 6 - 12 කාලපරිච්ජේදයක් ඇතුළත විෂය පවරා ඇත්තා වූ අමාත්‍යවරයා විසින් එය ගැසට් කිරීමෙන් පසුව ක්‍රියාත්මක වේ.[12]

[9] 43 වගන්තිය
[10] IV වන කොටස, 1, 23, 36, 40, 41, 42, 43 සහ 44 වගන්ති.
[11] 1(2) වගන්තිය. 2016 අගෝස්තු මස 04වැනි දින සහතික කිරීමේ දිනය වේ.
1(3) වගන්තිය

3වැනි පරිච්ඡේදය

# අමාත්‍යවරුන්ගේ සහ පොදු අධිකාරීවල යුතුකම්

3.1 පොදු අධිකාරීන්ට පනත යටතේ කිසියම් රාජකාරී තිබේද?

3.2 පොදු අධිකාරීන් වාර්තා පවත්වා ගෙන යා යුත්තේ කෙසේ ද?

3.3 අමාත්‍යවරුන්ට පනත යටතේ කිසියම් රාජකාරී තිබේ ද?

3.4 පොදු අධිකාරීහු කොමිෂන් සභාවට වාර්තා කිරීමට බැඳී සිටිත් ද?

3.5 මෙම පනත යටතේ ඉටු කළ රාජකාරී සම්බන්ධයෙන් පොදු අධිකාරීන්ගේ නිලධාරීන් වගකීමකට යටත් කරනු ලැබිය හැකි ද?

*පුරවැසියන්ගේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකමට පූර්ණ ක්‍රියාකාරීත්වයක් ලබා දීම සඳහා පනත මගින් අමාත්‍යවරුන් හා පොදු අධිකාරීන් මත ඇතැම් යුතුකම් හා වගකීම් පවරනු ලැබේ. වාර්තා පහසුවෙන් ලබා ගැනීම සඳහා නිසි වාර්තා පවත්වා ගෙනයාමත් සිය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කොමිෂන් සභාවට වාර්තා කිරීමත් මෙම යුතුකම්වලට ඇතුළත් වේ. විනිවිදභාවය වැඩි කිරීම සඳහා මෙම ක්‍රමවල ක්‍රියාකාරීත්වය අඛණ්ඩව වැඩිදියුණු කිරීම පොදු අධිකාරීන්ගේ වගකීම වේ.*

## 3.1 පොදු අධිකාරීන්ට පනත යටතේ කිසියම් රාජකාරී තිබේ ද?

- ඔව්. පොදු අධිකාරීන්ට ඔවුන්ගේ සියලුම වාර්තා සහ ලේඛන නිසි ආකාරයකින් පවත්වා ගෙනයාමේ යුතුකමක් ඇත. වාර්තා පහසුවෙන්, කලබලයකින් තොරව ලබා ගැනීම සඳහා නිසි පරිදි නාමාවලියක් සහ සුචියක් සේ සකස් කොට පවත්වා ගෙන යා යුතුය යන්න මෙයින් අදහස් වේ.[13]

- පොදු අධිකාරීන්ගේ වාර්තා නිසි පරිදි පවත්වාගෙනයාම පිළිබඳව කොමිෂන් සභාව කිසියම් නියෝග නිකුත් කරන්නේ නම් එම පොදු අධිකාරිය කොමිෂන් සභාවේ නියෝග අනුගමනය කළ යුතුය.[14]

## 3.2 පොදු අධිකාරීන් වාර්තා පවත්වා ගෙන යා යුත්තේ කෙසේ ද?

පොදු අධිකාරීන්ට ප්‍රමාණවත් සම්පත් තිබේ නම් ඔවුන්ගේ වාර්තා ඉලෙක්ට්‍රොනික ආකෘතිවලින් පවත්වා ගෙන යායුතු යැයි ද අපේක්ෂා කෙරේ.

## 3.3 අමාත්‍යවරුන්ට පනත යටතේ කිසියම් රාජකාරී තිබේ ?

- **ඔව්.** (මධ්‍ය ආණ්ඩුවේ සහ පළාත් සභා යන දෙකේම) අමාත්‍යවරු සෑම වසරකදීම දෙවරක් වාර්තා පළ කරනු ලබන බවට සහතික කර ගැනීමේ වගකීමක් ඇත (පිළිවෙලින් ජූනි මස 30ට සහ දෙසැම්බර් 31ට පෙර).[15]

- පුරවැසියන්ට සිය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම අර්ථාන්විතව ක්‍රියාත්මක කිරීමට සහායවීම පිණිස වාර්තාවලට තුළ විස්තීරණ තොරතුරු ඇතුලත් විය යුතුය.[16]

- වාර්තා සිංහල සහ දෙමළ භාෂාවලින් පළ කරනු ලබන අතර මහජනතාවට විද්‍යුත් ආකෘතියෙන් ලබා ගැනීමට සලස්වනු ඇත.[17]

---

[13] 7(1) වගන්තිය

[14] 7(2) වගන්තිය

[15] 8(1) වගන්ති

[16] 8(1) සහ 8(2) වගන්ති

[17] 8(4) (ආ) වගන්තිය

- මෙයට අමතරව, වාර්තාවේ පිටපත් මහජනතාවට ගාස්තුවක් ගෙවීම මත පරීක්ෂා කිරීමට සහ ලබා ගැනීමට සලස්වනු ලැබේ.[18]

## 3.4 පොදු අධිකාරීන්ට කොමිෂන් සභාවට වාර්තා කිරීමේ බැඳීමක් තිබේද?

- **ඔව්.** ඔවුන්ට එවැනි බැඳීමක් තිබේ. සෑම පොදු අධිකාරියකටම වාර්ෂික වාර්තා කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමේ වගකීමක් ඇති අතර ඒවා මහජනතාවට ලබා ගත හැකි විය යුතුය.
- වර්ෂය තුළ දී ලැබුණු මුළු ඉල්ලීම් ගණන, සපයන ලද සහ ප්‍රතික්ෂේප කරන ලද ඉල්ලීම් ගණන, වර්ෂය තුළ දී එකතු කරනු ලැබූ ගාස්තු මුදල සහ කොමිෂන් සභාවේ විධානය පරිදි තොරතුරු සපයන ලද වාර ගණන ආදිය වාර්ෂික වාර්තාවට ඇතුළත් විය යුතුය. විනිවිදභාවය පිළිබඳව පවත්නා ක්‍රමයේ ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යම් යෝජනා, ලැබූ අභියාචනා ගණන සහ වාර්තා පවත්වා ගෙනයාමට අදාළ ව්‍යවහාර පිළිබඳ තොරතුරු ආදිය ද එයට ඇතුළත් විය යුතුය.
- මෙම වාර්තා ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවලින් තිබිය යුතු වන අතර ඉලෙක්ට්‍රොනික ආකෘතියෙන් ද තිබිය යුතුය.[19]

## 3.5 මෙම පනත යටතේ ඉටු කළ රාජකාරී සම්බන්ධයෙන් පොදු අධිකාරීන්ගේ නිලධාරීන් වගකීමකට යටත් කළ හැකි ද?

**නැත.** පොදු අධිකාරීන්ගේ නිලධාරීන් සහ පොදු අධිකාරීන් මෙම පනත මගින් ඔවුන්ට ලබා දී ඇති රාජකාරී සහ/හෝ බලතල සද්භාවයෙන් ඉටු කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී කිසිදු අපරාධ හෝ සිවිල් වගකීමකට යටත් නොකළ යුතුය.[20] නමුත් වංකභාවයක් පෙනී යන්නේ නම්, එය පසුව විස්තර කරනු ලබන පරිදි පනත යටතේ වරදක් වනු ඇත.

---

[18] 8(4) (ආ) වගන්තිය

[19] 10 වගන්තිය

[20] 30 වගන්තිය

4වැනි පරිච්ඡේදය

# තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාපටිපාටිය

4.1 ක්‍රියාපටිපාටිය කුමක් ද?

4.2 නව ව්‍යාපෘතියක් පිළිබඳ තොරතුරු

4.3 තුන්වැනි පාර්ශ්වවලින් ලබා දුන් තොරතුරු සඳහා නියමිත ක්‍රියාපටිපාටිය

4.4 ගාස්තු

4.5 මහජනතාවට පොදු අධිකාරියක සීමාවක් නොමැති කාලපරිච්ඡේදයක අතීත වාර්තා වෙත ප්‍රවේශය තිබිය හැකි ද?

4.6 'තොරතුරු සඳහා ඉල්ලීමක' ඇතුළත් විය යුත්තේ කුමක් ද?

4.7 කොපමන ඉක්මනින් තීරණයක් දැන ගත හැකි ද?

4.8 තොරතුරු වෙත ප්‍රවේශවීම සඳහා වූ කාලපරිච්ඡේදය දීර්ඝ කළ හැකි ද?

4.9 ඔබට තොරතුරු ලබා දෙන්නේ කෙසේ ද?

4.10 ඔබට පොදු අධිකාරියක තීරණ සඳහා හේතු දක්වන ලෙස ඉල්ලා සිටිය හැකි ද?

4.11 ඔබට තොරතුරු සඳහා ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමේ හේතු දැන ගත හැකි ද?

*තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම අර්ථාන්විතවීම සඳහා තොරතුරු පහසුවෙන් ලබා ගැනීමේ ක්‍රියාපටිපාටීන් ඇති කිරීම අවශ්‍ය වේ. සෑම පොදු අධිකාරියක් විසින්ම සිය ආයතන තුළ තොරතුරු ලබාදීමේ ක්‍රම ක්‍රියාත්මක කිරීම, එම අධිකාරියෙන් මහජනතාවට ලබා ගත හැකි සියලුම තොරතුරු පිළිබඳ ලැයිස්තු සහ තොරතුරු සඳහා ගාස්තු ප්‍රකාශයට පත් කිරීම කළ යුතුය. එමෙන්ම ඔවුන් විසින් සාධාරණ කාලයක් ඇතුළත තොරතුරු ලබාදීම ද අවශ්‍ය වේ. පොදු අධිකාරීහු මහජනතාවට තොරතුරු හෙළිදරව් කිරීමේ දී උපරිම හෙළිදරව් කිරීමේ සහ ප්‍රගාමී හෙළිදරව් කිරීමේ මූලධර්මවලින් පාලනය වෙති.*

## 4.1 ක්‍රියාපටිපාටිය කුමක් ද?

- අවශ්‍ය තොරතුරු පිළිබඳ විස්තර නිශ්චිතව දක්වමින් අදාළ තොරතුරු නිලධාරියා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම.
- ඔබට ඔබේ ඉල්ලීම ලිවීමට නොහැකි නම්, වාචික ඉල්ලීමක් කිරීමටත් එය ඔබ වෙනුවෙන් සටහන් කර ගැනීමටත් තොරතුරු නිලධාරියා ඔබට සහාය විය යුතුය.[21]
- ඔබ තොරතුරු ලබා ගැනීම සඳහා පොදු අධිකාරියකට ඉල්ලීමක් කිරීමට අපේක්ෂා කරන්නේ නම්, හෝ ඔබ දැනටමත් ඉල්ලීමක් කර ඇතත් එය අනුමත ආකෘතියට අනුව සැකසී නැත්නම්, ගාස්තුවක් අය නොකර අදාළ ඉල්ලීම අනුමත ආකෘතියෙන් සිදු කිරීම සඳහා තොරතුරු නිලධාරියා ඔබට සහාය විය යුතුය.[22]
- තොරතුරු නිලධාරියකු වෙත ඉල්ලීමක් ලැබුණු විට ඔහු/ ඇය ඒ ඉල්ලීම ලැබූ බව දැන්විය යුතුය.[23]
- තොරතුරු නිලධාරියකුට ඔබට ප්‍රතිඋත්තරයක් ලබා දීමට හැකි වන්නේ නම්, සහ ඔබ එම ප්‍රතිඋත්තරයෙන් සෑහීමකට පත්වන්නේ නම්, තොරතුරු නිලධාරියා එම ඉල්ලීම සහ ප්‍රතිඋත්තරය පිළිබඳ වාර්තාවක් තබා ගත යුතුය.[24]

## 4.2 නව ව්‍යාපෘතියක් පිළිබඳ තොරතුරු

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන විෂයභාර අමාත්‍යවරයා (එනම් විදේශීය ආධාර ලබන ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වන විට එක්සත් ජනපද ඩොලර් මිලියන එකක් ඉක්මවන සහ දේශීය වශයෙන් ආධාර ලබන ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වන විට රුපියල් ලක්ෂ පහක් ඉක්මවන ව්‍යාපෘතියක්)[25],

[21] 24(1) වගන්තිය
[22] 24(2) වගන්තිය
[23] 24(3) වගන්තිය
[24] 24(4) වගන්තිය
[25] 9(3) වගන්තිය

ව්‍යාපාතියක් ආරම්භ කිරීමට මාස තුනකට පෙර පොදුවේ මහජනතාවට මෙන්ම එම ව්‍යාපෘතියෙන් සෘජුවම බලපෑමක් එල්ලවන තැනැත්තන්ට ව්‍යාපෘතිය ආරම්භ කරන බව දැනුම් දිය යුතුය.[26]

- එය හදිසි ව්‍යාපෘතියක් නම්, ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සතියකට (01) පෙර තොරතුරු ලබා දිය හැකි වන නමුත් ව්‍යාපෘතියේ හදිසි ස්වභාවය සඳහා වූ හේතු කොමිෂන් සභාවට දැනුම් දිය යුතුය.[27]
- ඔබ ව්‍යාපෘතියේ කිසියම් අදියරක් ඇතුළත අමාත්‍යවරයාට ලිඛිත ඉල්ලීමක් යොමු කරන්නේ නම්, යාවත්කාලීන තොරතුරු ඔබට ලබා දීමේ වගකීමක් අමාත්‍යවරයාට ඇත.[28]

## 4.3 තුන්වැනි පාර්ශ්වවලින් ලබා දුන් තොරතුරු සඳහා නියමිත ක්‍රියාපටිපාටිය

- ඔබ තුන්වැනි පාර්ශ්වයක් සම්බන්ධ වන රහසිගත තොරතුරු ඉල්ලා සිටින්නේ නම්, තොරතුරු නිලධාරියා එම ඉල්ලීම සතියක් ඇතුළත එම තුන්වැනි පාර්ශ්වයට ලිඛිතව දැනුම් දිය යුතුය.
- තොරතුරු ලබා දී ඇති තුන්වැනි පාර්ශ්වය එවිට එසේ දැනුම් දී සතියක් ඇතුළත එම තොරතුරු හෙළිදරව් කිරීමට කැමති විය යුතුය නැතහොත් හේතු සහිතව එම හෙළිදරව් කිරීම ප්‍රතික්ෂේප කළ යුතුය.
- තොරතුරු නිලධාරියා ඔහුගේ තීරණය ගැනීමේ දී තුන්වැනි පාර්ශ්වයේ ප්‍රතිචාර සැලකිල්ලට ගත යුතුය.
- තුන්වැනි පාර්ශ්වය එකී ඉල්ලීමේ නිවේදනයට ප්‍රතිචාර නොදක්වන්නේ නම්, හෝ හෙළිදරව් කිරීමට කැමැත්ත පළ නොකරන්නේ නම්, තොරතුරු නිලධාරියාට එම තොරතුරු හෙළිදරව් කළ හැකිය.
- තුන්වැනි පාර්ශ්වය හෙළිදරව් කිරීම ප්‍රතික්ෂේප කිරීමට ප්‍රතිචාර දක්වන්නේ නම්, එවිට තොරතුරු නිලධාරියා ඉල්ලා සිටින ලද තොරතුරු ප්‍රතික්ෂේප කළ යුතුය.[29]
- කෙසේවුව ද, තුන්වැනි පාර්ශ්වය විසින් තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රතික්ෂේප කර තිබුණ ද එසේ හෙළිදරව් කිරීම තුන්වැනි පාර්ශ්වයේ පෞද්ගලික බැඳියාවට වඩා වැදගත් වන බව ඔබට ඔප්පු කළ හැක්කේ නම්, එවිට තොරතුරු නිලධාරියා ඉල්ලා සිටින ලද තොරතුරු හෙළිදරව් කළ යුතුය.[30]

[26] 9 (1) (අ) වගන්තිය
[27] 9 (1) (අ) වගන්තියේ අතුරු විධානය
[28] 9 (2) වගන්තිය
[29] 29 (1) හා (2) වගන්ති
[30] 29 වගන්තියේ අතුරු විධානය


## 4.4 ගාස්තු

- තොරතුරු සඳහා ගෙවිය යුතු ගාස්තු කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.[31]
- සෑම පොදු අධිකාරියකට ඔවුන්ගේ කාර්යාල පරිශ්‍රය තුළ ප්‍රකටව පෙනෙන ස්ථානයක ගාස්තු ප්‍රදර්ශනය කිරීමට වගකීමක් ඇත.[32]

## 4.5 මහජනතාවට පොදු අධිකාරියක සීමාවක් නොමැති කාලපරිච්ඡේදයක අතීත වාර්තා වෙත ප්‍රවේශය තිබිය හැකි ද?

**නැත.** පොදු අධිකාරියක් විසින් පවත්වා ගත යුත්තේ 2016 අගෝස්තු මස 4වැනි දිනට පෙර[33] එය සතුව තිබූ වාර්තා අවුරුදු 10ක කාලසීමාවක් සඳහා පමණි.[34]

පොදු අධිකාරියක් අලුත් වාර්තා, එනම් 2016 අගෝස්තු මස 04වැනි දිනෙන් පසුව සකසනු ලබන වාර්තා පවත්වා ගත යුත්තේ එම වාර්තා සකස් කළ දින සිට අවුරුදු 12ක කාලසීමාවක් සඳහා පමණි.[35]




එහෙත් අවුරුදු 10කට හෝ 12කට පසුව වුව ද 'තොරතුරු සඳහා ඉල්ලීමක්', අභියාචනයක් හෝ එවැනි වාර්තාවක් පිළිබඳව අධිකරණ ඉදිරියේ නීති කෘත්‍යයක් තිබේ නම් පොදු අධිකාරියට එහි වාර්තා විනාශ කළ නොහැකිය.[36]

---

[31] පනතේ 25 (4) වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් (කිසියම් සීමාවක් දක්වා වූ) තොරතුරු ගාස්තුවකින් තොරව ලබාදීමට තීරණය කළ හැකිය. කොමිෂන් සභාව මගින් තීරණය කිරීමට නියමිත ගාස්තු උපලේඛණයේ මෙම කරුණ පිළිබඳ නිශ්චිත විස්තර ඇතුලත් වනු ඇත.

[32] 26(1)(ඈ) වගන්තිය

[33] 2016 අගෝස්තු මස 04වැනි දින තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පන පාර්ලිමේන්තුවේ සම්මත වීමෙන් පසුව කථානායකතුමා විසින් සහතික කළ දිනය වේ. එබැවින් එදින පනතේ ක්‍රියාත්මකවීමේ දිනය වේ.

[34] 7 (3)(අ) වගන්තිය

[35] 7 (3)(ආ) වගන්තිය

[36] 7 (4) වගන්තිය

## 4.6 'තොරතුරු සඳහා ඉල්ලීමක' ඇතුළත් විය යුත්තේ කුමක් ද?

- තොරතුරු සඳහා ඉල්ලීම ලිඛිතව ඉදිරිපත් කළ යුතු වුව ද ඉලෙක්ට්‍රොනිකව එනම්, ෆැක්ස් හෝ විද්‍යුත් තැපෑල මඟින් ද එසේ කළ හැකිය. ඉල්ලා සිටින ලද නිශ්චිත තොරතුරු හඳුනා ගැනීමට අවශ්‍ය තොරතුරු නිලධාරියාට සියලුම තොරතුරු එහි ඇතුළත් විය යුතුය. එමෙන්ම ප්‍රවේශයේ ස්වභාවය හා භාෂාව ද එහි ඇතුළත් විය යුතුය. කෙසේවුව ද, ඔබ සම්බන්ධ කර ගත හැකි විස්තර හැරුණු කොට වෙනත් පෞද්ගලික විස්තර අවශ්‍ය නොවේ.[37]

> උදා. ඔබට X යන අමාත්‍යාංශයේ 2014 හා 2015 අවුරුදු සඳහා වූ වියදම් වාර්තාවල ඉලෙක්ට්‍රොනික ආකෘතිය ඉංග්‍රීසි භාෂාවෙන් අවශ්‍ය වන්නේ නම්, ඔබ ඉල්ලා සිටින වාර්තා ඉංග්‍රීසියෙන් සහ ඉලෙක්ට්‍රොනික ආකෘතියෙන් අවශ්‍ය කරන බවට සඳහන් කළ යුතුය.

- ඉල්ලා සිටින තොරතුරු පුද්ගලයකුගේ ජීවිතය ආරක්ෂා කර ගැනීමට ඉතා වැදගත් වන්නේ නම්, හෝ පුද්ගලයකුගේ පෞද්ගලික නිදහසට බලපෑම් කරන්නේ නම් ඔබ එම කරුණු ඔබගේ ඉල්ලීමෙහි සඳහන් කළ යුතුය.[38]

[37] 24 (5) (ඇ) වගන්තිය

[38] 24 (5) (ඈ) වගන්තිය

## අයදුම්පත්‍ර සඳහා ආදර්ශ ආකෘතිය *

**වෙත:** තොරතුරු නිලධාරියා,
(දෙපාර්තමේන්තුවේ නම)
(තැපැල් ලිපිනය)

**1. අයදුම්කරුගේ සම්පූර්ණ නම:** කමලා පෙරේරා මිය

**2. ලිපිනය:** අංක 332, ගාලු පාර, මොරටුව

**3. දුරකථන අංකය:** 011 250------- **විද්‍යුත් තැපෑල:** kamalap@gmail.com

**4. අයදුම්පත්‍රය භාර දුන් දිනය:** 2016 ඔක්තෝබර් මස 20

**5. දෙපාර්තමේන්තුවේ නම:** ඉතා වැදගත් වන්නේ නම්, මාර්ග සංවර්ධන අධිකාරිය

**6. ඉල්ලා සිටින තොරතුරු පිළිබඳ විස්තර:** (හැකිතාක් දුරට නිශ්චිත තොරතුරු සපයන්න)

උදා: මොරටුව හා නුගේගොඩ අතර විකල්ප මාර්ගය ඉදිකිරීම සඳහා කොපමණ මුදලක් වෙන් කරනු ලැබුවේ ද?

මාර්ගය ඉදිකිරීම සඳහා කොපමණ මුදලක් සැබවින්ම වියදම් වූයේ ද?

කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළේ කාට ද? ටෙන්ඩර පිරිවිතර මොනවාද? වැඩ සාර්ථක නිමාව සහතික කළ නිලධාරියාගේ නම හා තනතුර කුමක් ද?

**7. තොරතුරු ඉල්ලා සිටින කාලසීමාව:** 2010 ජනවාරි සිට වර්තමානය දක්වා

**8. ඉල්ලා සිටින තොරතුරේ ආකෘතිය හා භාෂාව:** වැඩ පරීක්ෂා කිරීම/ වාර්තා පරීක්ෂා කිරීම/ ඉංග්‍රීසි භාෂාවෙන් යුත් සහතික කළ පිටපත

**9. ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු:** 2016 ඔක්තෝබර් 15 දිනැති කුවිතාන්සි අංක. xxx

**10. වෙනත් සටහන්:** (ඉල්ලා සිටින තොරතුරු පුද්ගලයකුගේ ජීවිතය ආරක්ෂා කිරීමට ඉතා වැදගත් වන්නේ ද නැතහොත් එය පුද්ගලයකුගේ පෞද්ගලික නිදහසට බලපෑම් කරන්නේ ද යන්න)

---------------------------------

**අයදුම්කරුගේ අත්සන**

*මෙය අයදුම්පත්‍රය සඳහා සාම්පල ආකෘතියක් පමණි. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව මඟින් නියම කළ අයදුම්පත්‍ර ආකෘතියක් නොමැත්තේ නම් මිස එම තොරතුරු සඳහා ඉල්ලීමක් කිරීමේ දී එම කොමිෂන් සභාව විසින් අයදුම්පත්‍ර සඳහා නියම කරනු ලබන ආකෘතිය අනුගමනය කළ යුතුය.

## 4.7 තීරණයක් කොපමණ ඉක්මනින් දැන ගත හැකි ද?

- තොරතුරු නිලධාරියෙක් හැකි ඉක්මනින්, ඉල්ලීම ලැබී වැඩ කරන දින දහ හතරක් (14) ඇතුළත එම තොරතුරු ලබා දෙන්නේ ද නැද්ද යන්න පිළිබඳ ඔහුගේ/ ඇගේ තීරණය ඔබට දැනුම් දිය යුතුය. ඉල්ලීමකට ඉඩ ලබා දෙන විට, තොරතුරුවලට ප්‍රවේශවීමේ අවසරය දින දහ හතරක් (14) ඇතුළත දිය යුතුය.[39]
- ඉල්ලා සිටින තොරතුරු ඔබේ ජීවිතය සහ/ හෝ පෞද්ගලික නිදහස සම්බන්ධයෙන්[40] වන විට, තීරණය පැය හතළිස් අටක් (48) ඇතුළත සිදු කළ යුතුය.[40]

## 4.8 තොරතුරු වෙත ප්‍රවේශවීම වීමේ කාලපරිච්ඡේදය දීර්ඝ කළ හැකි ද?

- **ඔව්.** තොරතුරු වෙත ප්‍රවේශවීමට අවසර දී තිබෙන්නේ නම්, ඉල්ලීම කරනුයේ දින 14ක් ඇතුළත ඉදිරිපත් කිරීමට පරිපාලනමය වශයෙන් දුෂ්කර වන කරුණු රාශියක් සඳහා නම්, තීරණයේ සිට දින දහ හතරක් (14) ඇතුළත ප්‍රවේශයට අවසර දීමේ අවශ්‍යතාව, දින විසි එකක් (21) දක්වා දීර්ඝ කළ හැකිය. ආසන්නයේ පිහිටා නොමැති කාර්යාලයකින් වාර්තා සොයා බැලීම හා එකතු කිරීම අවශ්‍ය වන්නේ නම් සහ ඒ අනුව ඒවා දින 14ක් ඇතුළත සොයා ලබා ගැනීම දුෂ්කර වන්නේ නම් එවිට දීර්ඝ කිරීමක් ලබා දිය හැකිය.
- තොරතුරු ලබාදීමේ කාලපරිච්ඡේදය දීර්ඝ කළ යුතු වන්නේ නම්, තොරතුරු නිලධාරියා දින 14ක් ඇතුළත එසේ දීර්ඝ කිරීමේ හේතු සහ දීර්ඝ කිරීමේ කාලසීමාව ඔබට දැනුම් දිය යුතුය.
- දීර්ඝ කිරීමේ හේතු සම්බන්ධයෙන් ඔබ සෑහීමකට පත් නොවන්නේ නම් ඔබට නම් කළ නිලධාරියා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.[41]

## 4.9 ඔබට තොරතුරු ලබා දෙන්නේ කෙසේ ද?

- තොරතුරු ඉල්ලා සිටි ආකෘතියෙන් එය සපයනු ලැබේ. කෙසේවුව ද, එමඟින් අදාළ ලේඛනයට හෝ වාර්තාවට හානියක් සිදු වන්නේ නම් තොරතුරු නිලධාරියාට ඉල්ලා සිටි ආකෘතියෙන් තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ හැකිය. ඉල්ලා සිටින ලද ආකෘතියෙන් තොරතුරු ලබාදීමට තොරතුරු නිලධාරියාට නොහැකි වන්නේ නම් තොරතුරු වෙත ප්‍රවේශවීමේ උචිත විකල්ප ක්‍රමයක් සෙවීම සඳහා ඔහු ඔබට සහාය විය යුතුය.[42]

---

[39] 25(2) වගන්තිය. තීරණය වාසිදායක වන්නේ නම් තොරතුරු ඉල්ලන්නාට ඉල්ලා සිටි තොරතුරු වෙත ප්‍රවේශවීම සඳහා උපරිම දින 28ක් බලාසිටීමට අවශ්‍ය වන බව මෙයින් අදහස් වේ.

[40] පනතේ සිංහල පිටපතට අනුව ඕනෑම පුරවැසියෙක්ගේ ජීවිතයට හෝ නිදහසට බලපෑමක් වන විට ඉල්ලීමක් මේ ආකාරයෙන් සිදු කිරීම සඳහා කරුණු දක්වා ඇත. ඔහු/ ඇය තොරතුරු ඉල්ලන්නා වන්නේ ද නොවන්නේ ද යන්න නොතකා මෙම තත්ත්වය අදාළ වේ. කෙසේවුව ද ඉංග්‍රීසි පිටපතට අනුව අදිසියක් සඳහා වූ එවැනි ඉල්ලීමක් බලපෑමට ලක් වූ තැනැත්තා විසින්ම සිදු කළ යුතු බවට අඟවයි. කෙසේවුව ද, භාෂා අතර අනනුකූලතාවක දී අදාළ වන්නේ සිංහල භාෂා අනුවාදයයි.

[41] 25(3) වගන්තිය

[42] 25 (5) - (7) වගන්ති

*එමෙන්ම ඔබට අදාළ ද්‍රව්‍යයේ නියැදියක් ලබා ගැනීමට ද ඉල්ලා සිටිය හැකිය එනම්, ඔබ අවට ප්‍රදේශයේ මාර්ග අලුත්වැඩියා කිරීමක් සඳහා භාවිතා කරන ගල්තාර පිළිගත හැකි ආරක්ෂක හා ගුණාත්මක ප්‍රමිතියට අනුකූල වන්නේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා ඔබට ඒවායේ නියැදියක් ඉල්ලා සිටිය හැකිය.*

- ඔබට තොරතුරු වෙත ප්‍රවේශවීමට අවසර දී තිබෙන විට ඔබට අදාළ තොරතුරු අධීක්ෂණය කිරීමට; ලේඛන හෝ වාර්තාවල සටහන්, උද්ධෘත හෝ සහතික කළ පිටපත් ලබා ගැනීමට; භෞතික ද්‍රව්‍යවල සහතික කළ නියැදි ලබා ගැනීමට; ඩිස්කට්, ෆ්ලොපි, පටි, දෘෂ්‍ය කැසට්පට හෝ වෙනත් යම් විද්‍යුත් ක්‍රමයකින් හෝ මුද්‍රිත පිටපත් වශයෙන් තොරතුරු ලබා ගැනීමට හිමිකමක් තිබේ.[43]

එමෙන්ම ඔබට අදාළ ද්‍රව්‍යයේ නියැදියක් ලබා ගැනීමට ද ඉල්ලා සිටිය හැකිය එනම්, ඔබ අවට ප්‍රදේශයේ මාර්ග අලුත්වැඩියා කිරීමක් සඳහා භාවිතා කරන ගල්තාර පිළිගත හැකි ආරක්ෂක හා ගුණාත්මක ප්‍රමිතියට අනුකූල වන්නේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා ඔබට ඒවායේ නියැදියක් ඉල්ලා සිටිය හැකිය.

## 4.10 ඔබට පොදු අධිකාරියක තීරණ සඳහා හේතු දක්වන ලෙස ඉල්ලා සිටිය හැකි ද?

**ඔව්.** සාමාන්‍යයෙන් පොදු අධිකාරියක තීරණයකින් බලපෑමක් වන ඕනෑම තැනැත්තකුට එම තීරණය සඳහා හේතු දක්වන ලෙසට ඉල්ලා සිටිය හැකිය. හේතු ලිඛිතව ලබා දිය යුතුය.[44]

## 4.11 ඔබට තොරතුරු සඳහා ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමේ හේතු දැන ගත හැකි ද?

ඔව්. නිශ්චිත අවස්ථාවල දී තොරතුරු නිලධාරියකු විසින් තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළ විට, එම නිලධාරියා පහත දැක්වෙන තොරතුරු ඉල්ලුම්කරුට දන්වා යැවිය යුතුය;

- ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු,
- ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කළ යුතු කාලසීමාව, සහ
- එවැනි අභියාචනයක් ඉදිරිපත් කළ යුතු තැනැත්තා.[45]

[43] 27 වගන්තිය
[44] 27 (3) වගන්තිය
[45] 35 වගන්තිය

# APPLICATION PROCESS

**STEP 1**

Identify the information you need and the Public Authority holding the information

**STEP 2**

Complete and submit the application to the Public Authority along with the prescribed fee

**STEP 3**

Information Officer has to accept or reject your application within 14 days. If it involves the life or liberty of a person, the decision will be made within 48 hours

**IF ACCEPTED**

- Will allow access to information within 14 days
- If the information is difficult to access, will extend the period to allow access upto 21 days.

  In this case, the Information Officer has to inform you in writing of;

  - The duration of extension and
  - The reasons for the extension

**IF REJECTED**

The Information Officer has to inform you of;

- The grounds on which the request was refused,
- The period within which an appeal against the refusal ought to be submitted, and
- The person to whom such appeal should be submitted

**APPEAL**

5වැනි පරිච්ඡේදය

# තොරතුරු නිලධරයෝ සහ නම් කරන ලද නිලධරයෝ


5.1 තොරතුරු නිලධාරීන් යනු කවු ද?

5.2 තොරතුරු නිලධාරීන්ගේ කාර්ය මොනවා ද?

5.3 නම් කළ නිලධාරීන් යනු කවු ද?

5.4 ඔබ තොරතුරු නිලධාරියෙක් හෝ නම් කළ නිලධාරියෙක් සම්බන්ධ කර ගන්නේ කෙසේ ද?

*තොරතුරු නිලධාරයෝත් සහ නම් කරන ලද නිලධරයෝත් තොරතුරු වෙත ප්‍රවේශයට පහසුකම් සැලසීමේ දී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරති. පුරවැසියකුට තොරතුරු වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය වූ විට ඔහුව සම්බන්ධ වන පළමු වැනි නිලධරයෝ වන්නේ ඔවුහුය. අවශ්‍ය තොරතුරු වෙත ප්‍රවේශය ලබා දීමේ දී ඔවුහු පුරවැසියන්ට සහාය වීමට බැඳී සිටිති. එම සහාය ප්‍රතික්ෂේප කිරීම නීතිවිරෝධී වේ. ඔවුන් තොරතුරු වෙත ප්‍රවේශය ප්‍රතික්ෂේප කරන්නේ නම්, ඔවුන්ට ඔවුන්ගේ තීරණ සඳහා හේතු දැක්වීමේ වගකීමක් ඇත. එබැවින්, ඔවුන්ට අභිමත පරිදි තොරතුරු ප්‍රතික්ෂේප කළ නොහැක.*

## 5.1 තොරතුරු නිලධාරීන් යනු කවු ද?

සෑම පොදු අධිකාරියකම තොරතුරු නිලධාරියෙක් සිටිය යුතුය. ඇතැම් විට එක් පොදු අධිකාරියකට තොරතුරු නිලධාරීන් එක් අයෙකුට වැඩි පිරිසක් සිටිය හැකිය.[46]

## 5.2 තොරතුරු නිලධාරීන්ගේ කාර්ය මොනවා ද?

- තොරතුරු නිලධාරීහු ඔවුන්ගේ කාර්යාලවලට තොරතුරු ලබා ගැනීම සඳහා ඉදිරිපත් වන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කළ යුත්තෝය. එසේම ඔවුහු තොරතුරු ඉල්ලා සිටින පුරවැසියන්ට හැකි ඕනෑම ආකාරයකින් සහාය විය යුත්තෝය.[47]
- මෙම සේවා සැපයීමේ දී තොරතුරු නිලධාරීන්ට ඔවුන්ගේ අනෙකුත් නිලධාරීන්ගේ සහාය අවශ්‍ය වන්නේ නම්, එම අනෙකුත් නිලධාරීහු තොරතුරු නිලධාරීන්ට අනිවාර්යයෙන්ම සහාය විය යුත්තෝය.[48]

## 5.3 නම් කරන ලද නිලධරයෝ යනු කවරහු ද?

ඔබ තොරතුරු නිලධාරියාගේ තීරණයෙන් සෑහීමකට පත් නොවන්නේ නම්, ඔබට එම තීරණයට එරෙහිව එම පොදු අධිකාරියේ වෙනත් නිලධාරියකු වෙත අභියාචනය කළ හැකිය. මෙම නිලධාරියා "නම් කරන ලද නිලධාරියා" ලෙස හඳුන්වනු ලැබේ. නම් කරන ලද නිලධාරියා තොරතුරු නිලධාරියාට එරෙහි අභියාචන විමසා තීරණයක් දෙයි.[49]

තොරතුරු නිලධාරීන් පත් කරනු ලබන තෙක් පොදු අධිකාරීවල ප්‍රධානීන් හෝ ප්‍රධාන විධායක නිලධාරීන් එම පොදු අධිකාරීවල තොරතුරු නිලධාරීන් ලෙස කටයුතු කරනු ඇත.

46 28 වගන්තිය

47 23(1) වගන්තිය

48 23(2) වගන්තිය

49 23(3) වගන්තිය

## 5.4 ඔබ තොරතුරු නිලධාරියකු හෝ නම් කරන ලද නිලධාරියකු සම්බන්ධ කර ගන්නේ කෙසේ ද?

තොරතුරු නිලධාරියකු හෝ නම් කරන ලද නිලධාරියකු සම්බන්ධ කර ගැනීමට ඔබට අවශ්‍ය වන්නේ නම්, අදාළ පොදු අධිකාරියෙන් ඒ පිළිබඳ විස්තර ලබා ගත හැකිය. තොරතුරු නිලධාරියාගේ සහ නම් කරන ලද නිලධාරියාගේ සම්බන්ධ වීමේ විස්තර සෑම පොදු අධිකාරියකම පරිශ්‍රයේ ප්‍රකටව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කර ඇති අතර ඔවුන්ගේ වෙබ් අඩවිවලින් ද එම විස්තර සොයා ගත හැකිය.[50]

[50] 23 (1) වගන්තිය

6වැනි පරිච්ඡේදය

# තොරතුරු ප්‍රතික්ෂේප කළ හැකි හේතු

6.1 මෙම පනත යටතේ තොරතුරු ප්‍රතික්ෂේප කළ හැකි ද?

6.2 තොරතුරු ප්‍රතික්ෂේප කළ හැකි හේතු මොනවා ද?

6.3 ප්‍රතික්ෂේප කරන ලද තොරතුරු සඳහා “තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම” අනුව ඉදිරිපත් වන ඉල්ලීමකට යම් කාලසීමාවකට පසුව අවසර දිය හැකි ද?

6.4 ප්‍රවේශ විය නොහැකි තොරතුරු අන්තර්ගත වාර්තාවල අනෙක් කොටස්වලට ඔබට ප්‍රවේශ විය හැකි ද?

*බොහොමයක් මූලික අයිතිවාසිකම් මෙන් තොරතුරු දැනගැනීම සඳහා ඔබට ඇති අයිතිවාසිකම පරම අයිතිවාසිකමක් නොවේ. කෙසේවුව ද, පොදු අධිකාරියකට එය ප්‍රතික්ෂේප කළ හැක්කේ සීමිත අවස්ථා සමුච්ඡයක දී පමණි. ඔබට ලබාදීම ප්‍රතික්ෂේප කළ හැකි මේ වර්ගයේ හා ප්‍රභේදවල තොරතුරු සහ ඒවා ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථාවන් පනතින් ලැයිස්තුගත කරයි. කෙසේවුව ද, තොරතුරු හෙළිදරව් කිරීමෙන් නීත්‍යානුකූල ප්‍රමාණයකට හානියක් සිදු කළ හැකි වුව ද* ***හෙළිදරව් කිරීමෙන් මහජනතාවට ප්‍රතිලාභයක් අත් වන්නේ නම්****, එවැනි තොරතුරු හෙළිදරව් කිරීමට සිදුවීම ඉතාම වැදගත් පැතිකඩ වේ.*

## 6.1 මෙම පනත යටතේ තොරතුරු ප්‍රතික්ෂේප කළ හැකි ද?

**ඔව්.** මෙම පනත යටතේ තොරතුරු සඳහා වූ ඉල්ලීමක් ඇතැම් විට ප්‍රතික්ෂේප කළ හැකිය.[51] කෙසේවුව ද, තොරතුරු මහජන සුභසිද්ධිය වෙනුවෙන් හෙළිදරව් කළ නොහැකි බව ඔප්පු කිරීමේ භාරය පොදු අධිකාරිය සතු වේ.[52]

## 6.2 තොරතුරු ප්‍රතික්ෂේප කළ හැකි හේතු මොනවා ද?

පනත මඟින් තොරතුරු ප්‍රතික්ෂේප කළ හැකි හේතු ලැයිස්තුගත කර ඇත.[53]

(අ) යම් පුද්ගලයකුගේ පෞද්ගලිකත්වය අනවශ්‍ය ලෙස ආක්‍රමණය කරන පෞද්ගලික තොරතුරු,

(එහෙත්, ඉල්ලා සිටින තොරතුරු පොදු සුභසිද්ධියට අදාළ වන බව ඔබට ඔප්පු කළ හැකි නම් හෝ තොරතුරු අදාළ වන පුද්ගලයා ඔහුගේ අවසරය ලිඛිතව ලබා දෙන්නේ නම් එවැනි තොරතුරු වෙත ප්‍රවේශ විය හැකිය.)

(ආ) තොරතුරු හෙළිදරව් කරන්නේ නම්, රටේ ආරක්ෂාවට, එහි භෞමික අඛණ්ඩතාවට හෝ ජාතික ආරක්ෂාවට තර්ජනයක් එල්ල කරන්නේ නම්; හෝ වෙනත් යම් රටක් සමඟ ශ්‍රී ලංකාවේ සම්බන්ධතාවලට හානිකර වන්නේ නම්; හෝ ඉල්ලා සිටින තොරතුරු රහසිගතව හා ශ්‍රී ලංකාව භාර ගෙන ඇති අන්තර්ජාතික ගිවිසුමක හෝ කැපවීමක කාර්යය සඳහා එක්රැස් කර ගත් තොරතුරු වන්නේ නම්ත[54]

---

[51] 26 (1) වගන්තිය

[52] 5 (1) වගන්තිය

[53] 32(4) වගන්තිය සමඟ කියවිය යුතු 28 වගන්තිය

[54] 5(1) (අ)-(ග) වගන්තිය




(ඇ) තොරතුරු නිසි කලට පෙර හෙළිදරව් කරන්නේ නම්, විදේශ ව්‍යවහාර මුදල් හුවමාරුව, ණය කටයුතු, බදු කරුණු, භාණ්ඩ හා සේවාවල මිල පාලනය, සහ ශ්‍රී ලංකාව ඇතුළත්වීමට නියමිත වෙළඳ ගිවිසුම් ආදී රටේ ආර්ථිකයට බරපතළ හානියක් සිදු විය හැකි අවස්ථාවක්.

> උදාහරණය: “” නම් තැනැත්තෙක් ඉදිරි දින කීපය සඳහා වූ විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු අනුපාතික පිළිබඳ තොරතුරු මහ බැංකුවෙන් ඉල්ලා සිටී. මෙම තොරතුරු කල් ඇතිව හෙළිදරව් කිරීම රටේ හුවමාරු උත්පාදන ආදායමට අනර්ථදායක විය හැකිය. එබැවින්, “” වෙත මෙම තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ හැකිය.

(ඈ) තොරතුරු 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ වාණිජ රහස්, වෙළඳ රහස් හෝ බුද්ධිමය දේපළවලට සම්බන්ධ වන්නේ නම් සහ එවැනි තොරතුරු හෙළිදරව් කිරීම තුන්වන පාර්ශ්වයක තරඟකාරී තත්ත්වයට හානිකර වන්නේ නම්.

(කෙසේවුව ද, එවැනි තොරතුරු හෙළිදරව් කිරීම මහජන සුභසිද්ධියට හේතු වන බවට පොදු අධිකාරිය සෑහීමකට පත් වන්නේ නම් පොදු අධිකාරියට එම තොරතුරු හෙළිදරව් කළ හැකිය.);

[55] The determination of what amounts to public interest will be made by the RTI Commission. An appeal lies to the Court against the decision.

(ඉ) තොරතුරු කිසියම් පුද්ගලයෙක්ගේ වෛද්‍ය තත්ත්වයට සම්බන්ධ වන්නේ නම්, එම තොරතුරු අදාළ වන තැනැත්තා විසින් තොරතුරු හෙළිදරව් කිරීමට ඔහුගේ/ ඇගේ ලිඛිත අවසරය ලබා දී තිබෙන්නේ නම් මිස;

(ඊ) වෘත්තිකයෙක් සේවා සපයන වෘත්තිකයෙක් සහ පොදු අධිකාරියක් අතර හුවමාරු වූ තොරතුරු. නීතියෙන් මෙවැනි තොරතුරු හෙළිදරව් කිරීම තහනම් කර ඇති අවස්ථාවල දී මෙම තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ හැකිය. නීතිපතිවරයා හෝ ඔහුගේ/ ඇගේ වැඩ තුළින් නීතිපතිවරයාට සහාය දක්වන යම් නිලධාරියෙක් සහ පොදු අධිකාරියක් අතර ඇති තොරතුරු හුවමාරු කිරීමක් මෙයට ඇතුලත් වේ;

(උ) භාරකාර සම්බන්ධතාවක් අතරතුර ලබා දුන් තොරතුරු[55];

> භාරකාර සම්බන්ධතාවක් සඳහා උදාහරණයක්:-
>
> (i). 'M' නම් සේවාදායකයෙක් විසින් ඔහුගේ මූල්‍ය තත්ත්වය නීති ආධාර කොමිෂන් සභාව පත් කළ සිය නීතිඥයා වෙත හෙළිදරව් කරයි. නීතිඥයා සහ 'M' අතර ඇති සම්බන්ධතාව භාරකාර සම්බන්ධතාවක් වන බැවින් මෙම තොරතුරු හෙළිදරව් කළ නොහැකිය.
>
> (ii). 'K' නම් තැනැත්තා රෝගයකින් පීඩා විඳින අතර ඔහුගේ සෞඛ්‍ය පිළිබඳ තොරතුරු ඇති 'H' නම් වෛද්‍යවරයාගෙන් ප්‍රතිකාර ලබා ගනී. H සහ K අතර ඇති සම්බන්ධතාව භාරකාර සම්බන්ධතාවක් වන බැවින් 'K' ගේ සෞඛ්‍ය පිළිබඳ තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඌ) තොරතුරු හෙළිදරව් කිරීම මඟින් විමර්ශනයකට හෝ වරදකරුවන් අල්ලා ගැනීමට හෝ ඔවුන්ට එරෙහිව නඩු පැවරීමට හානි සිදු කරන අවස්ථාවක හෝ පොලීසියට හෝ හමුදාවට නිර්නාමිකව සහාය දෙන ඔත්තුදෙන්නෙක් හෙළිදරව් කරන අවස්ථාවක්;

(එ) තොරතුරු තුන්වැනි පාර්ශ්වයක් විසින් අදාළ පොදු අධිකාරියට රහසිගතව සපයා ඇති අවස්ථාවක දී සහ අදාළ පෞද්ගලික සුභසිද්ධියට වඩා මහජන සුභසිද්ධිය බලවත් වන විට හැරුණු කොට එම තොරතුරු හෙළිදරව් කිරීම සඳහා එම තුන්වැනි පාර්ශ්වය විසින් අනුමැතිය ලබා දී නොමැති අවස්ථාවක්;

(ඒ) තොරතුරු හෙළිදරව් කිරීම අධිකරණයට අපහාස කිරීමක් හෝ අධිකරණයේ අපක්ෂපාතීත්වයට හානිකර වන අවස්ථාවක්;

(ඔ) තොරතුරු හෙළිදරව් කිරීම පාර්ලිමේන්තුවේ හෝ පළාත් සභාවක වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් වන අවස්ථාවක්;

(ඕ) තොරතුරු හෙළිදරව් කිරීම විභාග දෙපාර්තමේන්තුව හෝ උසස් අධ්‍යාපන ආයතනයක් විසින් පවත් වනු ලබන විභාගයක් සම්බන්ධයෙන් ඇති මහජන විශ්වාසයට හානිකර වන අවස්ථාවක්;

---

[55] මහජන සුභසිද්ධිය යන්නට කුමක් ඇතුළත් වන්නේ ද යන තීරණය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව මඟින් ගනු ඇත. මෙම තීරණයට එරෙහි අභියාචනයක් අධිකරණයට ඉදිරිපත් කළ හැකිය.




(ක) අමාත්‍ය මණ්ඩලය විසින් මෙතෙක් තීරණයක් ගෙන නොමැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් හා සම්බන්ධ තොරතුරු වන අවස්ථාවක්ත හෝ

(ග) නෛතික වශයෙන් රහසිගතව තබා ගැනීමට අවශ්‍ය මැතිවරණ කොමසාරිස් විසින් පවත්වනු ලබන මැතිවරණයකට සම්බන්ධ තොරතුරු වන අවස්ථාවක්.

## 6.3 ප්‍රතික්ෂේප කරක ලද තොරතුරු සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම අනුව ඉදිරිපත් වන ඉල්ලීමකට යම් කාලසීමාවකට පසුව අවසර දිය හැකි ද?

**ඔව්.** (අ), (ආ), (ඇ), (ඉ), (ඊ), (උ), (ඌ) සහ (ඒ) ඡේදවල සඳහන් කර ඇති තොරතුරු හැර අනෙක් තොරතුරු අවුරුදු දහයකට වඩා පැරණි නම් පොදු අධිකාරියකට එම තොරතුරු සඳහා ප්‍රවේශවීමේ අවසරය ප්‍රතික්ෂේප කළ නොහැකිය.[56]

වඩාත් වැදගත් ලෙස, ඔබට අතික්‍රමණ මහජන සුහසිද්ධියක් ඔප්පු කළ හැකි වන්නේ නම් සහ එවැනි මහජන සුහසිද්ධියක් එම තොරතුරු හෙළිදරව් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සිදු වන කිසියම් හානිකර ප්‍රතිඵලවලට වඩා විශාල වන්නේ නම් සාමාන්‍යයෙන් ප්‍රතික්ෂේප කළ හැකි කිසියම් තොරතුරක් හෙළිදරව් කළ යුතුය.[57]

කෙසේවුව ද, අවුරුදු 10ක් ඉකුත්වීමෙන් පසුව වුව ද විදේශ වෙළඳ ගිවිසුමක් සම්බන්ධ සාකච්ඡා අවසන් වී නොමැති නම්, පොදු අධිකාරියකට එවැනි ගිවිසුමක් පිළිබඳ තොරතුරු හෙළිදරව් කළ නොහැකිය.[58]

---

[56] භාරකරුගේ ඉහළ දැනුම හෝ පුහුණුව හේතුවෙන් එක් තැනැත්තෙක් වෙනත් තැනැත්තෙක් මත තබන නෛතික, සදාචාරමය හෝ සදාචාරාත්මක විශ්වාසයක් (භාරකාර).

[57] 5(2) වගන්තිය

[58] 5(4) වගන්තිය

## 6.4 ප්‍රවේශ විය නොහැකි තොරතුරු අන්තර්ගත වාර්තාවල අනෙක් කොටස්වලට ඔබට ප්‍රවේශ විය හැකි ද?

නීත්‍යනුකූලව ප්‍රතික්ෂේප කළ හැකි තොරතුරු හැරුණු කොට වෙනත් තොරතුරු වාර්තාවේ හෝ ලේඛනයේ අන්තර්ගත වන්නේ නම්, ඔබට එම ඉතිරි තොරතුරු වෙත ප්‍රවේශවීමට ඉල්ලා සිටිය හැකිය. තොරතුරුවල ප්‍රවේශ විය හැකි කොටසට ඇති ඔබේ ප්‍රවේශය අධිකාරීන්ට ප්‍රතික්ෂේප කළ නොහැකිය.[59]




[59] 5 (3) වගන්තිය

# 7වැනි පරිච්ඡේදය

# අභියාචනා

7.1 ඔබට තොරතුරු නිලධාරීන්ගේ තීරණවලට එරෙහිව අභියාචනා කළ හැකි ද?

7.2 තොරතුරු නිලධාරීන්ගේ තීරණවලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීමේ ක්‍රියාපටිපාටිය කුමක් ද?

7.3 ඔබට නම් කළ නිලධාරියෙක්ගේ තීරණයට එරෙහිව අභියාචනා කළ හැකි ද?

7.4 කොපමණ ඉක්මනකින් අභියාචනා ඉදිරිපත් කළ යුතු ද?

7.5 කොමිෂන් සභාවට අභියාචනා කිරීමේ ක්‍රියාපටිපාටිය කුමක් ද?

7.6 කොමිෂන් සභාව එහි තීරණ සඳහා හේතු දැක්විය යුතු ද?

7.7 32වැනි වගන්තිය යටතේ කොමිෂන් සභාව ගත් තීරණවලට එරෙහිව ඔබට අභියාචනා කිරීමට ක්‍රියාපටිපාටියක් තිබෙන්නේ ද?

7.8 කරුණු ඔප්පු කළ යුත්තේ කවරෙක් ද ? (ඔප්පු කිරීමේ භාරය)

7.9 ඔබට ඔබ වෙනුවෙන් අභියාචනා කිරීම සඳහා වෙනත් තැනැත්තෙක් යොදා ගත හැකි ද?

*පොදු අධිකාරීන්ගේ තීරණවලට එරෙහි අභියාචනා මගින් පොදු අධිකාරීන් අත්තනෝමතිකව කටයුතු නොකරන බවටත් තොරතුරු හෙළිදරව් කිරීම සඳහා යුක්තිසහගත උත්සාහයක් ගන්නා බවටත් සහතික කරයි. තොරතුරු වෙත ප්‍රවේශය ප්‍රතික්ෂේප කරනු ලැබුවොත් එම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අභියාචනා කිරීම සඳහා ඔබට හිමිකමක් ඇත. තොරතුරු නිලධාරීන්ගේ, නම් කළ නිලධාරීන්ගේ සහ කොමිෂන් සභාවේ ද තීරණවලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය පනත මගින් විස්තරාත්මකව දක්වා ඇත. මෙමගින් ඔබට ඔබේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් උදා කරයි.*

## 7.1 ඔබට තොරතුරු නිලධාරීන්ගේ තීරණවලට එරෙහිව අභියාචනා කළ හැකි ද?

**ඔව්.** ඔබට පුළුවන්.[60]

(අ) තොරතුරු නිලධාරීන් තොරතුරු ලබා ගැනීම සඳහා ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන්නේ නම්;

(ආ) තොරතුරු නිලධාරීන් පනත යටතේ තොරතුරු හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවට ඇති ව්‍යතිරේඛයක් දක්වමින් තොරතුරු හෙළිදරව් කිරීමට ප්‍රතික්ෂේප කරන්නේ නම්;

(ඇ) තොරතුරු නිලධාරීන් කාල රාමු අනුගමනය නොකරන්නේ නම්;

(ඈ) තොරතුරු නිලධාරීන් සම්පූර්ණ නොවූ, නොමඟ යවන හෝ සාවද්‍ය තොරතුරු ලබා දෙන්නේ නම්;

(ඉ) තොරතුරු නිලධාරීන් වැඩිපුර ගාස්තු අය කරන්නේ නම්;

(ඊ) තොරතුරු නිලධාරීන් ඉල්ලා සිටින ආකෘතියෙන් තොරතුරු සැපයීමට ප්‍රතික්ෂේප කරන්නේ නම්;

(උ) ඉල්ලා සිටි තොරතුරු විකෘතිකර, විනාශ කර හෝ අස්ථානගත කර ඇති බවට ඔබ යුක්තිසහගතව විශ්වාස කරන විට;

ඔබට ඔබේ තොරතුරු ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම හෝ ක්‍රියාව සිදු කර හෝ අභියාචනය කරනු ලබන හේතු පිළිබඳව දැන ගත් දින සිට දින දහ හතරක් (14) ඇතුලත නම් කළ නිලධාරියා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. ඔබ දින 14ක කාලය ඉක්මවුව ද එම ප්‍රමාදය සඳහා හේතු වූ කරුණු ඔබේ පාලනයෙන් තොර වූ බවට ඔප්පු කළ හැකි වන්නේ නම් නම් කළ නිලධාරියාට ඔබේ අභියාචනය භාර ගත හැකිය.[61]

[60] 6 වගන්තිය
[61] 31 වගන්තිය

## 7.2 තොරතුරු නිලධාරීන්ගේ තීරණවලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීමේ ක්‍රියාපටිපාටිය කුමක් ද?

අභියාචනයක් ඉදිරිපත් කළ විට නම් කළ නිලධාරියා විසින් වැඩ කරන දින තුනක් (03) ඇතුළත ඔබට අභියාචනය භාරගත් බවට දැනුම් දෙමින් කුවිතාන්සියක් නිකුත් කරනු ඇත. නම් කළ නිලධාරියා විසින් සති තුනක් (03) ඇතුළත නිශ්චිත හේතු සහ පදනම් ඇතිව අභියාචනය පිළිබඳව තීරණයක් ගත යුතුය. ඔබ ඔබේ අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමට ප්‍රමාද වුව ද ඔබ එම ප්‍රමාදය සඳහා පිළිගත හැකි හේතු ඉදිරිපත් කරන්නේ නම්, නම් කළ නිලධාරියාට අභියාචනයක් පිළිගැනීමට සහ ඒ පිළිබඳව තීරණයක් ගැනීමට අයිතියක් ඇත.

## 7.3 ඔබට නම් කළ නිලධාරියාගේ තීරණයට එරෙහිව අභියාචනා කළ හැකි ද?

**ඔව්.** ඔබට අවස්ථා දෙකක දී නම් කළ නිලධාරියෙක්ගේ තීරණයට එරෙහිව කොමිෂන් සභාවට අභියාචනා කළ හැකිය;

(අ) ඔබ තොරතුරු නිලධාරියෙක්ට එරෙහිව සිදු කළ අභියාචනයක දී නම් කළ නිලධාරියෙක් ගත් තීරණයෙන් සෑහීමකට පත් නොවන්නේ නම්; හෝ

(ආ) නම් කළ නිලධාරියා තොරතුරු නිලධාරියෙක්ට එරෙහි අභියාචනයක් පිළිබඳව තීරණයක් සති තුනක් (03) ඇතුළත ලබාදීමට අපොහොසත් වන්නේ නම්.[62]

## 7.4 කොපමණ ඉක්මනකින් අභියාචනා ඉදිරිපත් කළ යුතු ද?

- (අ) අවස්ථාවේ දී තීරණය දැනුම් දීමෙන් හෝ (ආ) අවස්ථාවේ දී තීරණයක් ගැනීමට අපොහොසත් වීමෙන් මාස දෙකක් (02) ඇතුළත අභියාචනය ඉදිරිපත් කළ යුතුය.
- කොමිෂන් සභාව විසින් දින තිහක් (30) ඇතුළත එහි තීරණය ලබා දිය යුතුය.
- ඔබ ප්‍රමාද වූයේ ඔබේ පාලනයෙන් තොර කරුණක් හේතුවෙන් නම් කොමිෂන් සභාවට අභියාචනයක් පිළිගත හැකිය.

## 7.5 කොමිෂන් සභාවට අභියාචනා කිරීමේ ක්‍රියාපටිපාටිය කුමක් ද?

කොමිෂන් සභාව පිහිටුවීමෙන් මාස හයක් (06) ඇතුළත කොමිෂන් සභාව මඟින් එයට අභියාචනා ඉදිරිපත් කිරීමේ ක්‍රියාපටිපාටිය සකස් කර ප්‍රසිද්ධ කරනු ඇත.

[62] චේතනා නොකළ ප්‍රමාද හෝ දැනුවත්භාවයක් නොමැතිකම ආදී කරුණු හේතුවෙන් නිශ්චිත කාලයෙන් බැහැර ඉදිරිපත් කළ අභියාචනා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් රීති සකස් කළ හැකිය.

## 7.6 කොමිෂන් සභාව එහි තීරණ සඳහා හේතු දැක්විය යුතු ද?

කොමිෂන් සභාව සිය තීරණ සඳහා හේතු ලිඛිතව ලබාදීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතුය. මෙම හේතු අභියාචක වෙත, තොරතුරු නිලධාරියා වෙත සහ අදාළ පොදු අධිකාරිය වෙත දැනුම් දිය යුතුය.[63]

## 7.7 32වැනි වගන්තිය යටතේ කොමිෂන් සභාව ගත් තීරණවලට එරෙහිව ඔබට අභියාචනා කිරීමට ක්‍රියාපටිපාටියක් තිබෙන්නේ ද?

**ඔව්.** ඔබ හෝ පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවේ තීරණයෙන් සෑහීමකට පත් නොවන්නේ නම්, කොමිෂන් සභාව සිය තීරණය අදාළ පාර්ශ්වයන්ට දැනුම් දීමෙන් දින දහ හතරක් (14) ඇතුළත ඔබට/ඔහුට/ඇයට/එයට එකී තීරණයට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනා කළ හැකිය.[64]

## 7.8 කරුණු ඔප්පු කළ යුත්තේ කවරෙක් ද (ඔප්පු කිරීමේ භාරය) ?

අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, තමා සතුව ඇති කොන්දේසිවලට අනුකූලව කටයුතු කර ඇති බව පෙන්වීමේ ඔප්පු කිරීමේ භාරය පොදු අධිකාරිය වෙත පැවරී ඇත.[65]

## 7.9 ඔබට ඔබ වෙනුවෙන් අභියාචනා කිරීම සඳහා වෙනත් තැනැත්තෙක් යොදා ගත හැකි ද?

**ඔව්.** කිසියම් හේතුවක් නිසා ඔබට අභියාචනාවක් ඉදිරිපත් කිරීමට නොහැකි වන්නේ නම්, ඔබ විසින් ලිඛිත බලය පවරනු ලැබ ඇති වෙනත් තැනැත්තෙක්ට ඔබ වෙනුවෙන් අභියාචනය කළ හැකිය.[66]

63 32(2), (3) සහ (5) වගන්තිය
64 32 (1) වගන්තිය
65 32(1) වගන්තිය
66 32 (1) වගන්තිය

# APPEALS PROCESS

STEP 1

The Information Officer;

- Rejects a request for information;
- Rejects access to information citing an exemption;
- Does not follow time frames;
- Provides incomplete, misleading or false information;
- Charges excessive fees;
- Refuses to provide information in the requested form

OR

You have a reasonable belief that the requested information has been deformed, destroyed or misplaced;

OR

You are not satisfied with the reasons for the extension

STEP 2

Appeal to the Designated Officer within 14 days of;

- Request for information being refused, or
- The act being committed, or
- Becoming aware of the grounds on which the appeal is being made.

Designated Officer may accept the appeal out of time if you exceed 14 days for reasons beyond your control

STEP 3

Designated Officer issues a receipt of Appeal within 3 working days

**STEP 4**

Designated Officer makes a decision on the Appeal with reasons within 3 weeks

**STEP 5**

Appeal to the RTI Commission within 2 months;

If you are not satisfied with the decision of the Designated Officer,

OR

If the Designated Officer does not make a decision within 3 weeks

RTI Commission may accept the appeal out of time if you exceed 14 days for reasons beyond your control

**STEP 6**

RTI Commission has to make a decision within 30 days with reasons given

**STEP 7**

Make an Appeal to the Court of Appeal within 14 days if you are not satisfied with the decision of the RTI Commission

8වැනි පරිච්ඡේදය

# දැඩුවම්

8.1 මෙම පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කිසියම් දැඩුවම් තිබෙන්නේ ද?

8.2 මෙම පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් තොරතුරු නිලධාරීන්ට සහ/හෝ අභියාචනා භාරගැනීමට නම් කළ නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත හැකි ද?

8.3 තොරතුරු හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් පොදු අධිකාරියක නිලධාරියෙක්ට හෝ සේවකයෙක්ට දැඩුවම් කළ හැකි ද?

*තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම ඉතාම වැදගත් අයිතිවාසිකමක් ලෙස හඳුනා ගෙන ඇත. එබැවින් පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම දැඩි දඬුවම් ලැබීමට හේතුවක් වේ. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට තනිවම දඬුවම පැණවීමට කිසිදු බලයක් නොමැත. උල්ලංඝනය කිරීම්වල ප්‍රතිඵලයක් ලෙස ලැබෙන දඬුවම් අධිකරණය මගින් පණවනු ලැබේ. කෙසේවුව ද කොමිෂන් සභාවට එම කරුණ අධිකරණයක් ඉදිරියට ගෙන යා හැකිය. එමෙන්ම එයට උල්ලංඝනය කිරීම් විනය පියවර සඳහා යොමු කිරීමට ද හැකිය.*

## 8.1 පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කිසියම් දඬුවම් තිබෙන්නේ ද?

ඔව්. කිසියම් තැනැත්තෙක් පහත දැක්වෙන ක්‍රියාවන්ගෙන් එකක් හෝ සිදු කරන්නේ නම්, කොමිෂන් සභාවට එම තැනැත්තාව අධිකරණයක් ඉදිරියට ගෙන යා හැකියත [67]

(අ) තොරතුරු වෙත ප්‍රවේශය සිතාමතාම වැළැක්වීම හෝ චේතනාන්විතව වැරදි සහගත, අසම්පූර්ණ හෝ නිවැරදි නොවන තොරතුරු සැපයීම;

(ආ) ඔහුගේ/ ඇගේ සන්තකයේ ඇති තොරතුරු විනාශ කිරීම, අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ පූර්ණ හෝ අර්ධ වශයෙන් වසන් කිරීම;

(ඇ) කොමිෂන් සභාව ඉදිරියේ පෙනීසිටීමට ඉල්ලා ඇති විට එසේ කිරීමට අපොහොසත්වීම හෝ ප්‍රතික්ෂේප කිරීම;

(ඈ) කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිය ද,

- (i) කොමිෂන් සභාව මඟින් ප්‍රශ්න කිරීම පැහැර හරිනු ලැබීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ
- (ii) ඔහු/ ඇය සතු කිසියම් තොරතුරක් ඉදිරිපත් කිරීම පැහැර හරිනු ලැබීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ
- (iii) දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම යටතේ චේතනාන්විතව සාවද්‍ය තොරතුරු සැපයීමත

(ඉ) කොමිෂන් සභාවේ තීරණයක් ක්‍රියාත්මක කිරීම පැහැර හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම;

(ඊ) කොමිෂන් සභාවේ හෝ එහි සේවකයින්ගේ බලතල ක්‍රියාත්මක කිරීම වැළැක්වීම හෝ අවහිර කිරීම;

(උ) පනත උල්ලංඝනය කරමින් තොරතුරු හෙළිදරව් කිරීම;


කිසියම් තැනැත්තෙක් ඉහත දක්වා ඇති ඕනෑම ක්‍රියාවක් සිදු කරන්නේ නම්, ඔහු/ ඇය වරදකට වරදකරු වේ. ඔහුට/ ඇයට විරුද්ධව නඩු පවරනු ලබන අතර වැරදිකරු බවට ඔප්පු වුවහොත් රුපියල් පනස් දහසක් **(රු. 50,000/-) හෝ ඊට අඩු දඩ මුදලකට හෝ අවුරුදු දෙකකට අඩු කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම** යටත් කරනු ඇත.

මෙයට අමතරව, පොදු අධිකාරියක සේවයේ නියුක්ත කිසියම් වෙනත් නිලධාරියෙක් එම අධිකාරියේ තොරතුරු නිලධාරියාට සාධාරණ හේතු නොමැතිව ඔහුගේ/ ඇගේ සහාය හා සේවාව ලබාදීමට අපොහොසත් වන්නේ නම්, ඔහු/ ඇය ද වරදකට වරදකරු වේ.

[67] 32 (2) වගන්තිය

ඔහුට/ ඇයට විරුද්ධව අධිකරණයක නඩු පවරනු ලැබීමෙන් පසුව වරදකරු බවට ඔප්පු වුවහොත් රුපියල් දහ දහසක් (රු. 10,000/-) හෝ ඊට අඩු දඩයකට යටත් කරනු ඇත.[68]

ඉහත දක්වන ලද දඬුවම්වලට අමතරව වරදකරු වූ පාර්ශ්වයන් ඔවුන්ගේ ආයතන තුළ අදාළ විනය බලධාරීන් විසින් විනය පාලනයකට ද භාජනය කරනු ලැබේ.




## 8.2 මෙම පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් තොරතුරු නිලධාරීන්ට සහ/හෝ අභියාචනා භාරගැනීමට නම් කළ නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත හැකි ද?

**ඔව්.** තොරතුරු නිලධාරියෙක්;

(i) තොරතුරු සඳහා වූ ඉල්ලීමක් භාරගැනීමට ප්‍රතික්ෂේප කරන්නේ නම්;

(ii) හේතු දැක්වීමකින් තොරව තොරතුරු සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන්නේ නම්;

(iii) අධික ගාස්තු ඉල්ලා සිටින්නේ නම්හ හෝ

(iv) වෙනත් ආකාරයකින් ඉල්ලීමක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අපොහොසත් වන්නේ නම්,

කොමිෂන් සභාවට එම කරුණ තොරතුරු නිලධාරියා සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කරන තැනැත්තාගේ හෝ ආයතනයේ අවධානය සඳහා යොමු කළ හැකිය.[69]

තව ද, අභියාචනා භාරගැනීමට නම් කළ කිසියම් නිලධාරියෙක් විසින් චේතනාන්විතව,

(i) 5වැනි වගන්තිය යටතේ වූ හේතුවක් හැරුණු කොට වෙනත් යම් හේතුවක් නිසා අභියාචනයක් භාර ගැනීම ප්‍රතික්ෂේප කරන විට; හෝ

(ii) දක්වා ඇති කාලසීමාව ඇතුලත හේතුවක් නොමැතිව අභියාචනය පිළිබඳ තීරණයක් ගැනීමට අපොහොසත් වන විට

---

[68] 32 (3) වගන්තිය

[69] 34 වගන්තිය

කොමිෂන් සභාවට එම කරුණ නම් කළ නිලධාරියා සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කරන තැනැත්තාගේ හෝ ආයතනයේ අවධානය සඳහා යොමු කළ හැකිය.[70]

ඉහත නිලධාරීන් සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කරන තැනැත්තා හෝ ආයතනය මාසයක් (01) ඇතුලත එම කරුණ සම්බන්ධයෙන් ඔහු/ ඇය/ එය ගෙන ඇති පියවර පිළිබඳව කොමිෂන් සභාවට දැනුම් දිය යුතුය.[71]

## 8.3 තොරතුරු හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් පොදු අධිකාරියක නිලධාරියෙක්ට හෝ සේවකයෙක්ට දඬුවම් කළ හැකි ද?

නිලධාරියා මෙම පනත යටතේ හෙළිදරව් කිරීමට අවසර ඇති තොරතුරු හෙළිදරව් කරන්නේ නම්, නිලධාරියාව විනය හෝ වෙනත් ආකාරයක දඬුවමකට යටත් කළ නොහැකිය.

[70] 32 (4) වගන්තිය

[71] 33 වගන්තිය

9වැනි පරිච්ඡේදය

# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

9.1 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව යනු කුමක් ද?

9.2 කොමිෂන් සභාව ස්වාධීන ද?

9.3 කොමිෂන් සභාව එහි විනිවිදභාවය තහවුරු කරන්නේ කෙසේ ද?

9.4 කොමිෂන් සභාවේ කාර්යය හා කර්තව්‍යය මොනවා ද?

9.5 කොමිෂන් සභාව සතු බලතල මොනවා ද?

9.6 කොමිෂන් සභාවට අරමුදල් සැපයෙන්නේ කෙසේ ද?

9.7 කොමිෂන් සභාවේ මුදල් විගණනයට භාජනය වන්නේ ද?

*තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පනත සක්‍රීය ලෙස බලාත්මකවීම සඳහා ඇති අධීක්ෂණ ආයතනය වේ. එය ස්වාධීන හා විනිවිදභාවයෙන් යුත් ආයතනයක් වන අතර පොදු අධිකාරීන් මෙම පනත යටතේ වූ ඔවුන්ගේ කාර්යයන් නිසි පරිදි ඉටු කරන බවට සහතික කර ගත යුතුය. වෙනත් කරුණු අතර පොදු අධිකාරීන්ට පනතේ අවශ්‍යතාවන්ට අනුකූල වන ලෙසට විධානය කිරීමට, පනත උල්ලංඝනය කිරීම් සෝදිසි කිරීමට, එහි නාමය යටතේ නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට සහ කොමිෂන් සභාවට යොමු කළ අභියාචනා විභාග කිරීමට බලතල ඇත.*

## 9.1 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව යනු කුමක් ද?

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පනතේ සක්‍රීය බලාත්මකවීම සහතික කිරීම සඳහා පනත මඟින් පිහිටුවා ඇත. කොමිෂන් සභාව සංස්ථාවක් වන අතර නෛතික පුද්ගලත්වයක් ඇත. එබැවින් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පැවරිය හැකිය.[72]

## 9.2 කොමිෂන් සභාව ස්වාධීන ද?

**ඔව්.** එය ස්වාධීන කොමිෂන් සභාවකි. එහි සාමාජිකයින් තිදෙනෙක් කතෘවරු, ප්‍රකාශකවරු හා මාධ්‍යවේදී කණ්ඩායම්වලින්, ශ්‍රී ලංකා නීතිඥ සංගමයෙන් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට යවනු ලබන සිවිල් සමාජ සංවිධානවලින් කරන නාමයෝජනාවලින් නම් කරනු ලැබේ. ඉතිරි සාමාජිකයින් දෙදෙනා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මඟින් මහජන අයදුම්පත්‍ර ක්‍රියාවලියකින් තෝරා ගනු ලැබේ.

## 9.3 කොමිෂන් සභාව එහි විනිවිදභාවය තහවුරු කරන්නේ කෙසේ ද?

කොමිෂන් සභාව විනිවිදභාවය තහවුරු කිරීම පිණිස අවම වශයෙන් අවුරුද්දකට වරක් එහි සියලුම ක්‍රියාකාරකම් පිළිබඳව වාර්තාවක් සකස් කර ප්‍රකාශයට පත් කරනු ලැබේ. වාර්තාවේ එක් පිටපතක් විවාද කරනු පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අතර තවත් පිටපතක් ජනාධිපතිවරයා වෙත යවනු ලැබේ. වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සති දෙකකට (02) පසුව කොමිෂන් සභාව මහජනතාවට ප්‍රවේශය ලබා ගැනීම සඳහා එහි පිටපතක් සිය කාර්යාලයේ තබා ගත යුතුය. කොමිෂන් සභාව හැකි සෑම අවස්ථාවක දීම වාර්තාවේ පිටපතක් සිය වෙබ් අඩවියේ පළ කළ යුතුය.[73]

72 39 (1) වගන්තිය
73 39 (2) වගන්තිය

## 9.4 කොමිෂන් සභාවේ කාර්යය හා කර්තව්‍ය මොනවා ද?

කොමිෂන් සභාව;

(අ) පොදු අධිකාරීන්ගේ කාර්යසාධනය අධීක්ෂණය කිරීම සහ ඔවුන් සිය කාර්යය නිසි පරිදි ඉටු කරන බවට සහතික කරයි;

(ආ) ප්‍රතිසංස්කරණය සඳහා නිර්දේශ කරයි;

(ඇ) පනත යටතේ පොදු අධිකාරිය විසින් අය කරනු ලබන ගාස්තු නිශ්චය කිරීම සඳහා සාධාරණත්වය පදනම් කොට ගත් මාර්ගෝපදේශ නිකුත් කරයි;

(ඈ) තොරතුරු නිලධාරියෙක්ට ගාස්තුවක් අය කිරීමෙන් තොරව තොරතුරු ලබා දිය හැකි අවස්ථාවන් නියම කරයි;

(ඉ) ගාස්තු උපලේඛණය නියම කරයි;

(ඊ) පනත ඵලදායීව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් සඳහා පුහුණු කටයුතු භාර ගනී;

(උ) පනත යටතේ අවශ්‍යතා සහ පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ප්‍රසිද්ධියට පත් කරයිත සහ

(ඌ) වාර්තා නිසි පරිදි පවත්වා ගැනීම සඳහා පොදු අධිකාරීන් වෙත මාර්ගෝපදේශ නිකුත් කරයි.[74]

## 9.5 කොමිෂන් සභාව සතු බලතල මොනවා ද?

කොමිෂන් සභාවට පහත දැක්වෙන බලතල තිබේ:

(අ) පරීක්ෂණ පැවැත්වීම සහ කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙසට යම් තැනැත්තෙක් වෙත නියම කිරීම;

(ආ) කොමිෂන් සභාව ඉදිරියට කැඳවන ලද තැනැත්තන්ගෙන් ප්‍රශ්න කිරීම සහ ඔවුන් සතුව ඇති තොරතුරු සපයන ලෙසට ඔවුන්ගෙන් ඉල්ලා සිටීම. ඉල්ලා සිටින තොරතුරු පනත යටතේ හෙළිදරව් කිරීමෙන් මුක්ත කර ඇත්තේ නම්, එවිට කොමිෂන් සභාව විසින් එම තොරතුරු රහසිගතව පරීක්ෂා කළ යුතුය;

(ඇ) පොදු අධිකාරියක් සතු තොරතුරු පරීක්ෂා කිරීම;

(ඈ) යම් නිශ්චිත ආකෘතියකින් තොරතුරු සපයන ලෙසට පොදු අධිකාරිය වෙත විධානය කිරීම;

(ඉ) පොදු අධිකාරියක් රඳවා ගෙන සිටින තොරතුරු ප්‍රසිද්ධ කරන ලෙසට විධානය කිරීම;

(උ) අභියාචනා විභාග කිරීම සහ තීරණ ගැනීමත සහ

(ඌ) තොරතුරු නියම වේලාවට ලබා නොදුන්නේ නම් පුරවැසියෙක්ගෙන් අය කළ ගාස්තු ප්‍රතිපූරණය කරන ලෙසට විධානය කිරීම.[75]

එමෙන්ම කොමිෂන් සභාවට මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ දී වරදකරුවන්ට එරෙහිව නඩු පැවරීමට ද වැදගත් බලයක් ඇත.[76]

---

[74] 38 (1) වගන්තිය

[75] 38 (1) වගන්තිය

[76] 38 (2) වගන්තිය

## 9.6 කොමිෂන් සභාවට අරමුදල් සැපයෙන්නේ කෙසේ ද?

කොමිෂන් සභාවට එහිම අරමුදල් තිබේ. පාර්ලිමේන්තුව මගින් කොමිෂන් සභාවට වෙන් කරන කිසියම් මුදල් සහ කොමිෂන් සභාවට ලැබෙන පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදානවලින් අරමුදල සැදුම්ලත් වේ. කොමිෂන් සභාවට ත්‍යාග, පරිත්‍යාග හෝ ප්‍රදාන ලැබෙන විට එම අරමුදල්වල මූලාශ්‍රය සහ එම අරමුදල් කොමිෂන් සභාවට ලබාදීමේ අරමුණ ප්‍රසිද්ධ කිරීමට කොමිෂන් සභාව බැඳී සිටී. කොමිෂන් සභාවේ සියලුම වියදම් මෙම අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.[77]

## 9.7 කොමිෂන් සභාවේ මුදල් විගණනයට භාජනය වන්නේ ද?

**ඔව්.** කොමිෂන් සභාවේ ආදායම හා වියදම මූල්‍ය විගණනයට යටත් වේ. කොමිෂන් සභාවේ මූල්‍ය වර්ෂය ඕනෑම වසරක දී ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා වේ. කොමිෂන් සභාවේ සියලුම ආදායම හා වියදම නිරූපණය කරන නිසි ගිණුම් පවත්වා ගෙන යන බවට කොමිෂන් සභාව සහතික කරගත යුතුය.

රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සඳහා අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154වන ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කරනු ලැබේ.[78] කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සහ අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, ගිණුම් 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධානවලට යටත් වේ.[79]

[77] 40 වගන්තිය
[78] 11 වගන්තිය
[79] 12 වගන්තිය

# ඇමුණුම

## 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ
## අයිතිවාසිකම පිළිබඳ පනත

---

**(සහතිකය සටහන් කළේ 2016 අගෝස්තු මස 04 වන දින)**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2016 අගෝස්තු මස 05 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ 1 අයිතිවාසිකම පිළිබඳ පනත

(සහතිකය සටහන් කළේ 2016 අගෝස්තු මස 04 වන දින)

**එල්.ඩී.-ඕ.4/2015.**

**තොරතුරුවලට ප්‍රවේශවීමට ඇති අයිතිවාසිකම සම්බන්ධයෙන් විධිවිධාන සැළසීම සඳහා ද, තොරතුරු වෙත ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කළ හැකි හේතු නිශ්චිතව දැක්වීම සඳහා ද, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම සඳහා ද, තොරතුරු නිලධරයන් පත් කිරීම සඳහා ද, තොරතුරු ලබා ගැනීම සඳහා වන ක්‍රියාපටිපාටිය නිශ්චිතව දැක්වීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැළසීම පිණිස ද වූ පනතකි.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14අ ව්‍යවස්ථාව මගින් තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කර ඇති බැවින්, සහ තොරතුරු ලබා ගැනීමේ අයිතිවාසිකම බලාත්මක කිරීම මගින් පොදු අධිකාරීවල විනිවිදභාවය සහ වගකීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමේ අවශ්‍යතාවක් පැන නැගී ඇති බැවින් ද, එමගින් ශ්‍රී ලංකාවේ මහජනතාවට යහපාලනය සඳහා වැඩි වශයෙන් සහභාගි විය හැකි සහ රටේ පොදු ජන ජීවිතයේ දී සක්‍රීය ලෙස සහභාගි විය හැකි සමාජයක් ප්‍රවර්ධනය වන බැවින් ද; පූර්විකාව.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** (1) මේ පනත 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

(2) (2) මේ වගන්තියේ විධිවිධාන, ෂඪ වන කොටසේ, සහ 23, 36, 40, 41, 42, 43 සහ 44 වන වගන්තිවල විධිවිධාන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම පනත සම්බන්ධයෙන් සහතිකය පිටසන් කරනු ලබන දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(3) මේ පනතේ වෙනත් සියලු වගන්තිවල සඳහන් විධිවිධාන පොදු අධිකාරීන් හෝ පොදු අධිකාරීන් හි ප්‍රභේද සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි දිනවල දී බලාත්මක වන්නේ ය.

එසේ වුව ද, එසේ නියම කරනු ලබන දිනය ඉහත (2) උපවගන්තියේ සඳහන් සහතිකය සටහන් කිරීමේ දිනයෙන් පසුව අවම වශයෙන් මාස හයක් ඇතුළත විය යුතු අතර, එම සහතිකය සටහන් කිරීමේ දින සිට එක් අවුරුද්දකට වඩා වැඩි නොවන කාලයක දී මේ පනතේ විධිවිධාන සියලු පොදු අධිකාරීන් සඳහා අදාළ වන්නේ ය.

2– PL 009843-3,061 (2016/03)

**2.** මේ පනතේ විධිවිධාන සක්‍රීය ලෙස බලාත්මක වීම සහතික කිරීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය විෂය පවරා ඇත්තා වූ අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ වගකීම විය යුතු ය. සක්‍රීය ලෙස බලාත්මක වීම සහතික කිරීමේ වගකීම.

### I වන කොටස

### පනතේ විධිවිධාන අදාළ වීම

තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම.

**3.** (1) මේ පනතේ 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පොදු අධිකාරියක සන්තකයේ, භාරයේ හෝ පාලනයේ ඇති තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම සෑම පුරවැසියකුට ම තිබිය යුතු ය.

(2) මෙම පනතේ විධිවිධාන පාර්ලිමේන්තු බලතල, වරප්‍රසාද සහ පරිචයන් හීන කරනු නොලබන්නේ ය.

මේ පනතේ විධිවිධාන වෙනත් ලිඛිත නීතියක් අභිබවා බලපැවැත්විය යුතු බව.

**4.** වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර අනනුකූලතාවයක් හෝ ගැටීමක් ඇති අවස්ථාවක, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

## II වන කොටස

## තොරතුරුවලට ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කිරීම

ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථා.

**5.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්-

(අ) පුද්ගලික තොරතුරුවලට අදාළ තොරතුරු සම්බන්ධයෙන් වන විට, තොරතුරු හෙළිදරව් කිරීම යම් පොදු කටයුත්තක් හෝ සම්බන්ධතාවක් සඳහා කිසිදු සම්බන්ධයක් නොමැති අවස්ථාවක දී හෝ යම් තනි පුද්ගලයකුගේ පුද්ගලිකත්වය අනවසරයෙන් ආක්‍රමණය කිරීමක් සිදුවේ නම්, එම තොරතුරු හෙළිදරව් කිරීම විශාල වශයෙන් මහජන සුභසිද්ධිය විසින් සාධාරණීකරණය කරයි නම්, හෝ අදාළ තැනැත්තා විසින් එම හෙළිදරව් කිරීම සඳහා ලිඛිතව කැමැත්ත ලබා දී ඇත්නම් මිස;

(ආ) එම තොරතුරු හෙළිදරව් කිරීම -

(i) රාජ්‍ය ආරක්ෂාවට හෝ එහි භෞමික අඛණ්ඩතාවයට හෝ ජාතික ආරක්ෂාවට බරපතල ලෙස අගතිදායක වන අවස්ථාවක;

(ii) එම තොරතුරු යම් රජයක් හෝ ජාත්‍යන්තර නීතිය යටතේ වූ අන්තර්ජාතික ගිවිසුම් හෝ බැඳීම් විසින් රහසිගතව ලබා දුන් හෝ රහසිගතව ලබාගත් අවස්ථාවක, එම තොරතුරු හෙළිදරව් කිරීම එම රජය හෝ ජාත්‍යන්තර නීතිය යටතේ වූ අන්තර්ජාතික ගිවිසුම් හෝ බැඳීම් සමග ශ්‍රී ලංකාවේ ඇති සබඳතාවලට අගතිගාමී වන හෝ අගතිගාමී විය හැකි අවස්ථාවක;

(ඇ) එම තොරතුරු හෙළිදරව් කිරීම -

(i) විනිමය අනුප්‍රමාණ හෝ විදේශ හුවමාරු ගනුදෙනු පාලනය කිරීමට;

(ii) බැංකු කටයුතු හෝ ණය කටයුතු විධිමත් කිරීමට;

(iii) බදු පැනවීමට;

(iv) භාණ්ඩ සහ සේවාවල මිල ස්ථාවරව පවත්වා ගැනීම, පාලනය සහ ගැලපීමට, කුලී සහ අනෙකුත් පිරිවැය සහ වේතන අනුප්‍රමාණ, වැටුප් සහ අනෙකුත් ආදායම්; හෝ

(v) විදේශ වෙළඳ ගිවිසුම්වලට ඇතුළත් වීමට,

අදාළ ආණ්ඩුවේ ආර්ථික හෝ මුල්‍යමය ප්‍රතිපත්ති වෙනස් කිරීමට හෝ නොකඩවා පවත්වාගෙන යෑම සම්බන්ධ තීරණ නිසිකලට පෙර හෙළිදරව් වීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට බරපතල අගතියක් සිදුවිය හැකි අවස්ථාවක;

(ඈ) එම තොරතුරු හෙළිදරව් කිරීම විශාල වශයෙන් මහජන සුභසිද්ධිය සඳහා හේතුවන බවට පොදු අධිකාරිය විසින් සෑහීමට පත්වේ නම් මිස, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ ආරක්ෂා කර ඇති වාණිජ රහස්, වෙළඳ රහස් හෝ බුද්ධිමය දේපළ ඇතුළු තොරතුරු හෙළිදරව් කිරීම යම් තුන්වන පාර්ශවයක තරඟකාරී තත්ත්වයට අහිතකර ලෙස බලපානු ලබන්නේ නම්;

(ඉ) එම තොරතුරු, යම් තැනැත්තකුගේ වෛද්‍ය වාර්තා හෙළිදරව් කිරීමට මඟ පාදන අවස්ථාවක, එම තැනැත්තා විසින් සිය වෛද්‍ය වාර්තා පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීම සඳහා ලිඛිතව අනුමතය ලබා දී ඇත්නම් මිස;

(ඊ) ඔවුන්ගේ සේවා සැපයීමේ දී නීතිපතිවරයා හෝ නීතිපතිවරයාට සහාය දක්වන යම් නිලධරයකු සහ පොදු අධිකාරීන් අතර පවතින යම් සන්නිවේදනයක් ඇතුළුව, යම් ලිඛිත නීතියක් යටතේ හෙළිදරව් කිරීම සඳහා අවසර දී නොමැති වූ, වෘත්තිකයන් සහ එම වෘත්තිකයන් විසින් සේවා සපයනු ලබන යම් පොදු අධිකාරියක් අතර පවතින යම් සන්නිවේදනයක සංයුක්ත වන්නා වූ තොරතුරක් වන අවස්ථාවක දී;

(උ) භාරකාර සම්බන්ධතාවයක් පැවතීම හේතුවෙන් එම තොරතුරු රහසිගතව තබා ගැනීම අවශ්‍ය වන අවස්ථාවක දී;

(ඌ) එම තොරතුරු හෙළිදරව් කිරීම මගින් -

(i) යම් අපරාධයක් වැළැක්වීම හෝ ඒ පිළිබඳව සොයාගැනීම හෝ වරදකරුවන් අල්ලා ගැනීම හෝ ඔවුනට එරෙහිව නඩු පැවරීම සම්බන්ධයෙන් බලවත් අගතියක් සිදුවන අවස්ථාවක; හෝ

(ii) නීතිය බලාත්මක කිරීම හෝ ජාතික ආරක්ෂාවට අදාළ තොරතුරු පිළිබඳ රහසිගත මූලාශ්‍රයක අනන්‍යතාවය හෙළිවන අවස්ථාවක දී;

(එ) 29 (2) (ඇ) වගන්තියේ විධිවිධානවලට යටත්ව, එම තොරතුරු තෙවන පාර්ශවයක් විසින් අදාළ පොදු අධිකාරිය වෙත රහසිගතව සපයා ඇති අවස්ථාවක දී, එම තොරතුරු හෙළිදරව් කිරීම සඳහා එම පාර්ශවය විසින් අනුමතය ලබා දී නොමැති අවස්ථාවක;

(ඒ) එම තොරතුරු හෙළිදරව් කිරීම අධිකරණයට අපහාස කිරීමක් හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතීබව පවත්වාගෙන යාමට අගතියක් සිදු වන අවස්ථාවක දී;

(ඔ) එම තොරතුරු හෙළිදරව් කිරීම පාර්ලිමේන්තු වරප්‍රසාද හෝ නීතිය මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට පළාත් සභා වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් වන අවස්ථාවක දී;

(ඕ) විභාග දෙපාර්තමේන්තුව හෝ උසස් අධ්‍යාපන ආයතනයක් විසින් පවත්වනු ලබන යම් විභාගයකට අදාළ තොරතුරු රහසිගතව තබා ගැනීමට නියමිත වන්නා වූ අවස්ථාවක දී;

(ක) එම තොරතුරු තීරණයක් ගෙන නොමැති අමාත්‍ය මණ්ඩල සංදේශයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී ; හෝ

(ග) එම තොරතුරු අදාළ මැතිවරණ නීති මගින් රහසිගතව තැබීමට නියමිත වන්නා වූ මැතිවරණ කොමසාරිස්වරයා විසින් පවත්වනු ලබන මැතිවරණයකට සම්බන්ධ තොරතුරු වන අවස්ථාවක දී,

මේ පනත යටතේ ඒ තොරතුරුවලට ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඉල්ලා සිටිනු ලබන තොරතුරු අවුරුදු දහයකට වඩා පැරණි නම්, එම උපවගන්තියේ (අ), (ආ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ) සහ (ඒ) ඡේදවල දක්වා ඇති හේතු මත හැර එහි දක්වා ඇති කිසිදු හේතුවක් මත, තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(3) මේ වගන්තියේ (1) (ඇ) (ඞ) උපවගන්තියේ සඳහන් විදේශ ගිවිසුම් අවුරුදු දහයක් ඉකුත් වීමෙන් පසුව වුව ද අවසන් වී නොමැති අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් වූ තොරතුරු හෙළි නොකළ යුතු ය.

(4) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, මහජන සුභසිද්ධිය එම තොරතුරු හෙළිදරව් කිරීමෙන් වන හානියට වඩා වැඩි නම් එවැනි තොරතුරු සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ හෙළිදරව් කිරීමෙන් මුක්ත කර ඇති යම් තොරතුරක් වෙත ප්‍රවේශ වීම ප්‍රදානය කිරීමට අදාළ යම් ගැටලුවක් පිළිබඳව තොරතුරු නිලධරයකු විසින්, කොමිෂන් සභාවෙන් උපදෙස් ලබාගත හැකි අතර, කොමිෂන් සභාව විසින් හැකි ඉක්මනින් සහ එවැනි සෑම අවස්ථාවක දී ම දින දාහතරක් ඇතුළත ස්වකීය උපදෙස් ලබා දිය යුතු ය.

**6.** 5 වන වගන්තියේ දක්වා ඇති කවර හෝ හේතු මත තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවක, එම වගන්තිය යටතේ හෙළිදරව් කිරීමෙන් මුක්ත කොට නැති යම් තොරතුරු ඇතුළත් වූ ද, හෙළිදරව් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති තොරතුරු ඇතුළත් වන යම් කොටසකින් සාධාරණ ලෙස වෙන් කළහැකි වූ ද, යම් වාර්තාවක හෝ ලේඛනයක කොටසකට ප්‍රවේශය ලබා දිය හැකි ය.

ඇතැම් අවස්ථානුගත තත්ත්ව යටතේ වෙන් කිරීමේ හැකියාව.

## III වන කොටස
## අමාත්‍යවරුන්ගේ සහ පොදු අධිකාරීවල යුතුකම්

**7.** (1) මේ පනතේ විධිවිධාන සලසා ඇති ආකාරයට තොරතුරුවලට ප්‍රවේශවීමට ඇති අයිතිවාසිකම සුසාධනය කිරීම සඳහා නිසි අයුරින් සාදනු ලබන නාමාවලි සහ සුචියක් අනුව එහි ක්‍රියාත්මකවීමේ අවශ්‍යතා සමග අනුකූල වන ආකාරයට සහ ආකෘතියකට අනුව සෑම පොදු අධිකාරියක් විසින්ම සිය වාර්තා පවත්වාගෙන යෑම ඒ සෑම පොදු අධිකාරියකම වගකීම වන්නේ ය.

පොදු අධිකාරී විසින් එහි වාර්තා පවත්වාගෙන යා යුතු සහ ආරක්ෂා කළ යුතු බව..

(2) සෑම පොදු අධිකාරියක් විසින්ම (1) වන උපවගන්තිය යටතේ සිය වගකීම් ක්‍රියාත්මක කිරීමේ දී, 14 (උ) වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් දෙන ලද නියමයන්ට අනුකූලව ඉටු කළ යුතු ය.

(3) සෑම පොදු අධිකාරියක් විසින් ම පවත්වාගෙන යනු ලබන සියලු වාර්තා -

(අ) මේ පනත ක්‍රියාත්මකවීමේ දිනයේ දී එවකටත් පවතින වාර්තා සම්බන්ධයෙන් වන විට, මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට අවුරුදු දහයකට නොඅඩු කාලසීමාවක් සඳහා; සහ

(ආ) මේ පනත ක්‍රියාත්මකවීමෙන් පසුව සකසනු ලබන අලුත් වාර්තා සම්බන්ධයෙන් වන විට, එම වාර්තාව සකස් කළ දින සිට අවුරුදු දොළහකට නොඅඩු කාලසීමාවක් සඳහා, ආරක්ෂා කරනු ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක විෂය වස්තුව වන්නා වූ කිසිදු වාර්තාවක් හෝ තොරතුරක්, එම ඉල්ලීම හෝ එම ඉල්ලීමට අදාළ යම් අභියාචනයක් විභාග වන අතරතුර දී හෝ අධිකරණ කටයුත්තක් පවතින කාලය තුළ දී විනාශ නොකළ යුතු ය.

(5) 2 වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එය නොසලකමින්, සෑම පොදු අධිකාරියක් විසින් ම සම්පත්වල පැවතීමට යටත්ව, සාධාරණ කාලයක් ඇතුළත ස්වකීය සියලු වාර්තා විද්‍යුත් ලේඛනාකෘතියෙන් ආරක්ෂා කර තැබීම සඳහා උත්සුක විය යුතු ය.

වාර්තාවක් පළ කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ කාර්යභාරය.

**8.** (1) අර්ධ වාර්ෂිකව පිළිවෙළින් එක් එක් වර්ෂයේ ජූනි මස තිස් වන දිනට සහ දෙසැම්බර් මස තිස් එක් වන දිනට ප්‍රථම, කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ආකෘතියකට යම් පුරවැසියකුට මේ පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රදානය කොට ඇති තොරතුරුවලට ප්‍රවේශ වීමට ඇති අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමට හැකි වනු පිණිස වාර්තාවක් පළකිරීම එම අමාත්‍යවරයාගේ කාර්යය වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සඳහන් වාර්තාවේ පහත විස්තර අඩංගු විය යුතු යː-

(අ) එම අමාත්‍යවරයාට පවරා ඇති අමාත්‍යාංශයේ සංවිධානය, කර්තව්‍ය, ක්‍රියාකාරකම් සහ කාර්යට සම්බන්ධ විස්තර සහ එසේ පවරා ඇති කර්තව්‍ය තුළට වැටෙන සියලු පොදු අධිකාරීවල විස්තර;

(ආ) (අ) ඡේදයේ දක්වා ඇති අමාත්‍යාංශය සහ පොදු අධිකාරීන්වල -

(i) නිලධරයන් සහ සේවානියුක්තිකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සහ ඔවුන් විසින් සිය තීරණ ගැනීමේ දී අනුගමනය කරනු ලබන අදාළ ක්‍රියාපටිපාටි;

(ii) කර්තව්‍ය ඉටුකිරීමේ දී, කාර්ය කිරීමේ දී සහ බලතල ක්‍රියාත්මක කිරීමේ දී එහි නියමිත සම්මතයන්;

(iii) නිලධරයන් සහ සේවානියුක්තිකයන් සිය කාර්ය කිරීමේ දී, කර්තව්‍ය ඉටුකිරීමේ දී සහ බලතල ක්‍රියාත්මක කිරීමේ දී භාවිත කරනු ලබන රීති, නියෝග, උපදේශ, අත්පොත් සහ වෙනත් යම් ප්‍රභේදවල වාර්තා;

(iv) තොරතුරු ලබා ගැනීම සඳහා පුරවැසියන්ට ලබා ගත හැකි පහසුකම් පිළිබඳ විස්තර;

(v) මුදල් ප්‍රතිපූරණය කිරීමේ දී සියලු සැළසුම්, යෝජිත වියදම් හා වාර්තා පෙන්නුම් කරමින් එක් එක් නියෝජිත ආයතන වෙත වෙන් කරන ලද අයවැය;

(vi) පත්කොට ඇති තොරතුරු නිලධරයා හෝ නිලධරයන්ගේ නම, තනතුර සහ අනෙකුත් විස්තර.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට මාස හයක් ඇතුළත සෑම අමාත්‍යවරයකු විසින් ම නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියකින් (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල දක්වා ඇති තොරතුරු අඩංගු වාර්තාවක් පළ කිරීම, එම අමාත්‍යවරයාගේ කාර්යය වන්නේ ය.

(4) (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල දක්වා ඇති වාර්තා -

(අ) රාජ්‍ය භාෂාවලින් පළ කරනු ලැබිය යුතු අතර, විද්‍යුත් ලේඛනාකෘතියකින් ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය; සහ

(ආ) මහජන පරීක්ෂාව සඳහා ලබා ගැනීමට සැලැස්විය යුතු අතර, ඒවායේ පිටපත් කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන යම් ගාස්තුවක් ගෙවීම මත යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

සැක දුරු කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා යන යෙදුම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIA පරිච්ඡේදය යටතේ පිහිටුවා ඇති පළාත් සභාවක අමාත්‍යවරයකු ද ඇතුළත් වන බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**9.** (1) (අ) යම් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට මාස තුනකට පෙරාතුව, එම ව්‍යාපෘතියට අදාළ විෂයය පවරා ඇත්තේ යම් අමාත්‍යවරයෙකු වෙත ද, එකී සන්නිවේදනය කරන දිනය වන විට තමා සතු එම ව්‍යාපෘතියට අදාළ සියලු තොරතුරු පොදුවේ මහජනයාට සහ එම ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වීමට ඉඩ ඇති නිශ්චිත තැනැත්තන්ට සන්නිවේදනය කිරීම, එම අමාත්‍යාවරයාගේ කාර්යය වන්නේ ය:

ව්‍යාපෘතියකට මුලපිරීම සම්බන්ධයෙන් මහජනයාට දැනුම් දීමට අමාත්‍යවරුන්ට ඇති කාර්යභාරය.

එසේ වුව ද, හදිසි ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වන විට, ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සතියකට පෙරාතුව තොරතුරු ලබාදිය යුතු අතර, එම හදිසි තත්වය සඳහා වූ හේතු, කොමිෂන් සභාව වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(ආ) කොමිෂන් සභාව විසින් (අ) ඡේදයේ සඳහන් සන්නිවේදනය සිදු කළ යුතු ආකාරය නිශ්චිතව දක්වමින් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (අ) අමාත්‍යවරයකු විසින්, එම ව්‍යාපෘතිය සංවර්ධනය සහ ක්‍රියාත්මක කරන කාලසීමාව පුරා (1) වන උපවගන්තියේ දක්වා ඇති ව්‍යාපෘතියක් සම්බන්ධ යාවත්කාලීන තොරතුරු පුරවැසියකු විසින් තත් කාර්යය සඳහා ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත එම පුරවැසියාට ලැබීමට සැලැස්විය යුතු ය.

(ආ) එම තොරතුරු, කොමිෂන් සභාව විසින් තොරතුරු ලබාදීමේ කාර්යය සඳහා නියම කරනු ලැබිය යුතු යම් ගාස්තුවක් මත ලබා දිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා "ව්‍යාපෘතිය" යන්නෙන් -

(අ) විදේශ ආධාර ලබන ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වන විට, එක්සත් ජනපද ඩොලර් ලක්ෂයක් ඉක්මවන; සහ

(ආ) දේශීය වශයෙන් ආධාර ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් වන විට, රුපියල් ලක්ෂ පහක් ඉක්මවන,

යම් ව්‍යාපෘතියක් අදහස් වේ.

සැක දුරු කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා යන යෙදුම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIAඅ පරිච්ඡේදය යටතේ පිහිටුවා ඇති පළාත් සභාවක අමාත්‍යවරයකු ද ඇතුළත් වන බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වාර්තා ආදිය ඉදිරිපත් කිරීමට පොදු අධිකාරී සතු කාර්යභාරය.

**10.** සෑම පොදු අධිකාරියක් විසින්ම පහත දැක්වෙන තොරතුරු සපයමින් එහි කාර්යාලයේ දී සහ ස්වකීය නිල වෙබ් අඩවියෙහි මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා තැබිය යුතු වාර්ෂික වාර්තා, එකී වාර්තා අදාළ වන වර්ෂයට ඉක්බිතිවම එළඹෙන වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනයට පෙරාතුව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:-

(අ) වර්ෂය තුළදී ලැබුණු මුළු ඉල්ලීම් ගණන සහ සපයන ලද සහ ප්‍රතික්ෂේප කරන ලද තොරතුරු ප්‍රමාණය;

(ආ) වර්ෂය තුළදී එකතු කරනු ලැබූ ගාස්තු මුදල;

(ඇ) 5 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද ඉල්ලීම් ගණන;

(ඈ) කොමිෂන් සභාවේ විධානය පරිදි තොරතුරු සපයන ලද වාර ගණන;

(ඉ) විනිවිදභාවය පිළිබඳ පවත්නා ක්‍රමයේ ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යම් යෝජනා;

(ඊ) තොරතුරු සන්නිවේදනය කිරීම, ප්‍රතික්ෂේප කිරීම මගින් පැන නගින අභියාචන සංඛ්‍යාව;

(උ) වාර්තා පවත්වාගෙන යෑම, කළමනාකරණය සහ විනාශ කිරීමට අදාළ පරිචයන්; සහ

(ඌ) 8 වන වගන්තිය යටතේ ස්වකීය කර්තව්‍යයන්.

## IV වන කොටස

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම.

**11.** (1) මේ පනතේ කාර්යය සඳහා, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන (මේ පනතේ "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තිය මගින් එයට දෙන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් වන අතර, ඒ නාමයෙන් එය විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි විය යුතු ය.

කොමිෂන් සභාවේ සංයුතිය.

**12.** (1) කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන තැනැත්තන් පස්දෙනකුගෙන් සමන්විත විය යුතු ය. එම නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පහත සඳහන් එක් එක් සංවිධාන හෝ සංවිධාන ප්‍රභේද විසින් නම් කරනු ලබන එක් තැනැත්තකු නිර්දේශ කරනු ලැබිය යුතු ය:-

(අ) නීතිඥවරයන් සහ නීති ක්ෂේත්‍රයේ විද්වත් ප්‍රජාව විමසා නීතිඥ වෘත්තියේ ප්‍රවීණත්වයක් ඇති නීතිඥවරයෙක් හෝ නීති විශාරදයෙක් නම් කළ යුතු ශ්‍රී ලංකා නීතිඥ සංගමය;

(ආ) ප්‍රකාශකවරුන්ගේ, කර්තෘවරුන්ගේ සහ මාධ්‍යවේදීන්ගේ සංවිධාන; සහ

(ඇ) වෙනත් සිවිල් සමාජ සංවිධාන.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී, නිර්දේශ කරනු ලබන තැනැත්තන් -

(i) නීතිය, පාලනය, රාජ්‍ය පරිපාලනය, සමාජ සේවා, පුවත්පත් කලාවේදී, විද්‍යා හා තාක්ෂණ හෝ කළමනාකරණ යන ක්ෂේත්‍රවල සාධනය කළ දැනීමක්, අත්දැකීම් හා ප්‍රවීනත්වය සහිත පොදු සමාජ ජීවිතයේදී සුවිශේෂී තැනැත්තන් බවට;

(ii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හෝ, යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු නොවන බවට;

(iii) යම් රාජ්‍ය හෝ අධිකරණ ධුරයක් හෝ වෙනත් ලාභදායී ධුරයක් දරන තැනැත්තන් නොවන බවට;

(iv) යම් දේශපාලන පක්ෂයකට සම්බන්ධ නොවන බවට;

(v) යම් ව්‍යාපාරයක් කරගෙන යනු නොලබන හෝ යම් වෘත්තියක නොයෙදෙන බවට,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සහතික විය යුතු ය.

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තීරණය සඳහා තැනැත්තන් නම් කිරීමේ දී, එහි නිශ්චිතව දක්වා ඇති නිර්ණායක සපුරාලනු ලබන බවට (1) වන උපවගන්තියේ සඳහන් සංවිධාන විසින් සහතික විය යුතු ය. නාමිකයන් එහි සඳහන් නිර්ණායක සපුරාලනු නොලබන බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අදහස වන අවස්ථාවක දී, අලුත් නාම යෝජනා කැඳවනු ලැබිය යුතු ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින්, මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට එක් මාසයක් ඇතුළත හෝ කොමිෂන් සභාවේ පුරප්පාඩුව ඇතිවීමේ දින සිට එක් මාසයක් ඇතුළත (1) වන උපවගන්තිය යටතේ ස්වකීය නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම කාලසීමාව ඇතුළත අදාළ යම් හෝ සියලුම සංවිධාන විසින් නාම යෝජනා ඉදිරිපත් කිරීමට අපොහොසත්වන

අවස්ථාවක දී, එකී කාලසීමාව අවසන් වීමෙන් පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ස්වකීය නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. නාම යෝජනා ප්‍රතික්ෂේප වී ඇති අවස්ථාවක දී, එම ප්‍රතික්ෂේප වීමේ දින සිට සති දෙකක් ඇතුළත පිළිගත හැකි නාම යෝජනා නැවත ඉදිරිපත් කර නොමැති අවස්ථාවක දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ස්වකීය නාම යෝජනා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු එම ධුරය දරනු ලබන අතරතුර දී, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත්පාලන ආයතනයක සභිකයකු වශයෙන් පත් වුවහොත් හෝ යම් රාජ්‍ය හෝ අධිකරණ ධුරයක් සඳහා හෝ යම් දේශපාලන පක්ෂයක නිලධරයකු වශයෙන් තෝරා පත් කරනු ලැබුවහොත්, එවැනි සාමාජිකයකු එම පත්කිරීමෙහි සිට කොමිෂන් සභාවේ සාමාජිකයකු වීම අවසන් වන්නේ ය.

(5) ජනාධිපතිවරයා විසින්, කොමිෂන් සභාව වෙත පත් කරනු ලබන සාමාජිකයන් අතරින් එක් අයකු එහි සභාපතිවරයා ලෙස නම් කරනු ලැබිය යුතු ය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකයන් අවුරුදු පහක කාලසීමාවක් සඳහා ධුර දරනු ලැබිය යුතු ය.

(7) කොමිෂන් සභාවේ සාමාජිකයකු විසින් මේ පනතේ විධිවිධාන යටතේ හෙළිදරව් කළ නොහැකි තොරතුරු, හෙළිදරව් නොකළ යුතු ය.

(8) මේ පනතේ උපලේඛනයේ සඳහන් විධිවිධාන කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ එහි රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවා නියුක්තිකයන් පත් කිරීම.

**13.** (1) කොමිෂන් සභාව විසින්-

(අ) කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අධ්‍යක්ෂ ජනරාල්වරයකු;

(ආ) අවශ්‍ය බවට තීරණය කරනු ලබන යම් නිලධරයන් හා සේවා නියුක්තිකයන් සංඛ්‍යාවක්,

පත් කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාවේ පොදු අධීක්ෂණය, විධානය හා කළමනාකරණය සම්බන්ධයෙන් හා කොමිෂන් සභාවේ නිලධරයන්ගේ සහ සේවා නියුක්තිකයන්ගේ විනය පාලනය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකියනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත්කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයා හා වෙනත් නිලධරයන් සහ සේවා නියුක්තිකයන්, කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන යම් නියම හා සේවා කොන්දේසිවලට යටත් විය යුතු අතර, එම අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ වෙනත් නිලධරයන් හා සේවා නියුක්තිකයන් සඳහා මුදල් විෂයය පවරා ඇත්තා වූ අමාත්‍යවරයාගෙන් විමසා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

**14.** කොමිෂන් සභාවේ කාර්ය සහ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය:- කොමිෂන් සභාවේ කාර්ය සහ කර්තව්‍යය.

(අ) මෙම පනත යටතේ පොදු අධිකාරීන් වෙත පවරා ඇති කාර්ය නිසි පරිදි ඉටු කරන්නේ ද යන්න අධීක්ෂණය කිරීම සහ ඒවාට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න සහතික වීම;

(ආ) ප්‍රතිසංස්කරණය සමාලෝචනය කිරීම සඳහා අවශ්‍ය පොදු නිර්දේශ ස්වභාවයකින් යුක්ත වූ සහ විශේෂයෙන් ම යම් පොදු අධිකාරියක් වෙත යොමු කරන ලද යන දෙවර්ගයේ ම නිර්දේශ සෑදීම;

(ඇ) මේ පනත යටතේ යම් තොරතුරක් නිදහස් කරනු ලැබීම පිණිස පොදු අධිකාරී විසින් අය කරනු ලබන ගාස්තු නිශ්චය කිරීම සඳහා සාධාරණත්වය පදනම් කොට ගෙන මාර්ගෝපදේශ නිකුත් කිරීම;

(ඈ) තොරතුරු නිලධරයකු විසින්, ගාස්තුවක් අය කිරීමෙන් තොරව, තොරතුරු ලබාදිය හැක්කේ කවර අවස්ථාවල දී ද යන්න නියම කිරීම;

(ඉ) තොරතුරු සැපයීම සම්බන්ධයෙන් ප්‍රගාමී හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය මත පදනම් ව, ගාස්තු උපලේඛනය නියම කිරීම;

(ඊ) මෙම පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය නිලධරයන් සමඟ සාමූහිකව කටයුතු කිරීම හෝ එම නිලධරයන් සඳහා පුහුණු කටයුතු භාර ගැනීම;

(උ) මේ පනතේ අවශ්‍යතා සහ ඒ යටතේ පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ප්‍රසිද්ධියට පත් කිරීම; සහ

(ඌ) පොදු අධිකාරීන් සඳහා වාර්තා නිසි පරිදි පවත්වා ගැනීමේ මාර්ගෝපදේශ නිකුත් කිරීම.

**15.** මේ පනත යටතේ කොමිෂන් සභාවේ කාර්ය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව වෙත පහත දැක්වෙන බලතල ඇත්තේ ය:- කොමිෂන් සභාවේ බලතල.

(අ) පරීක්ෂණ පැවැත්වීම හා එම පරීක්ෂණ සඳහා පෙනීසිටින ලෙස යම් තැනැත්තකු වෙත නියම කිරීම;

(ආ) දිවුරුම්දීම හෝ ප්‍රතිඥාදීම යටතේ එම තැනැත්තා විභාග කිරීම හා අවශ්‍ය අවස්ථාවල දී එම තැනැත්තාගේ සන්තකයේ පවතින යම් තොරතුරු සපයන ලෙස එම තැනැත්තා වෙත නියම කිරීම, එසේ වුව ද 5 වන වගන්තිය යටතේ හෙළිදරව් කිරීමෙන් මුක්ත කර ඇති තොරතුරු රහසිගතව පරීක්ෂා කළ යුතු ය;

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ වූ යම් පොදු අධිකාරියක් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන තොරතුරු ඇතුළුව පොදු අධිකාරියක් විසින් දරනු ලබන තොරතුරු පරීක්ෂා කිරීම;

(ඈ) යම් නිශ්චිත ආකෘතියකින් තොරතුරු සපයන ලෙස පොදු අධිකාරියක් වෙත විධාන කිරීම;

(ඉ) 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මහජනතාවගෙන් යම් පොදු අධිකාරියක් විසින් රඳවාගෙන සිටිනු ලබන තොරතුරු ප්‍රසිද්ධ කරන ලෙස එම පොදු අධිකාරිය වෙත විධාන කිරීම;

(ඊ) 32 වන වගන්තිය යටතේ අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා විභාග කිරීම සහ තීරණය කිරීම; සහ

(උ) ඉල්ලා සිටිනු ලැබූ තොරතුරු නියමිත වේලාවට නොලැබීම හේතුවෙන් පුරවැසියෙකුගෙන් අය කරනු ලැබූ ගාස්තු ප්‍රතිපූරණය කරන ලෙස පොදු අධිකාරියක් හෝ අදාළ තොරතුරු සැපයීමේ නිලධරයකු වෙත විධාන කිරීම.

කොමිෂන් සභාවේ අරමුදල.

**16.** (1) කොමිෂන් සභාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර එම අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු යː-

(අ) කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල්;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ඕනෑම මූලාශ්‍රයකින් ලැබෙන පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් යම් මුදල් ලැබෙන අවස්ථාවක දී, එම පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදානවල මූලාශ්‍ර සහ ඒවා ප්‍රදානය කරනු ලබන අරමුණ ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කොමිෂන් සභාව විසින් දරනු ලබන වියදම් පියවා ගැනීමට අවශ්‍ය වන සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

**17.** (1) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, සිය ආදායම් සහ වියදම් සහ කොමිෂන් සභාවේ අනෙකුත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වාගෙන යා යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සඳහා අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

**18.** 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සහ ගිණුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටස අදාළ විය යුතු බව.

**19.** (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා, කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ නිලධරයන් සහ අනෙකුත් සියලු සේවා නියුක්තිකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන සෑම පරීක්ෂණයක් ම, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව අධිකරණ ක්‍රියාපටිපාටියක් සේ සලකනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන් ආදීන් රජයේ සේවකයන් විය යුතු බව.

**20.** කොමිෂන් සභාව, (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගත යුතු ය.

අල්ලස් පනත අදාළ වීම.

**21.** මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවා නියුක්තිකයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහු විසින් හෝ ඔහුට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, එම ක්‍රියාව හෝ නොකර හැරීම සද්භාවයෙන් කරන ලද්දක් බවට අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ නඩුවේ දී ඔහු විසින් දරන ලද යම් වියදමක් එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අය කරගනු ලැබුවේ නම් මිස, කොමිෂන් සභාවේ අරමුදලින් ඔහුට ගෙවනු ලැබිය යුතු ය.

යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී දරනු ලබන වියදම්.

**22.** කොමිෂන් සභාව විසින්, එය පිහිටුවීමෙන් මාස හයක් ඇතුළත, 32 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය සකස්කර, ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් ලබා දිය යුතු ය.

කාර්යපටිපාටික අවශ්‍යතා ප්‍රසිද්ධියට පත් කළ යුතු බව.

## V වන කොටස
## තොරතුරු නිලධරයන් පත් කිරීම සහ තොරතුරුවලට ප්‍රවේශය ලබාගැනීම සඳහා වන ක්‍රියාපටිපාටිය

**23.** (1) (අ) මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා, සෑම පොදු අධිකාරියක් විසින් ම, මේ පනත ක්‍රියාත්මක වීමෙන් මාස තුනක් ඇතුළත, එම පොදු අධිකාරියේ තොරතුරු නිලධරයන් වශයෙන් නිලධරයන් එක් අයෙකු හෝ ඊට වැඩි ගණනක් සහ අභියාචනා විභාග කිරීම සඳහා නම් කළ නිලධරයකු පත් කරනු ලැබිය යුතු ය.

තොරතුරු නිලධරයන් සහ නම් කළ නිලධරයන් පත් කිරීම සහ ඔවුන්ගේ කාර්ය.

(ආ) (අ) ඡේදය යටතේ තොරතුරු නිලධරයකු පත් කරනු ලබන තෙක්, පොදු අධිකාරියක ප්‍රධානියා හෝ ප්‍රධාන විධායක නිලධරයා, මේ පනතේ කාර්ය සඳහා එම පොදු අධිකාරියේ තොරතුරු නිලධරයා ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) සෑම තොරතුරු නිලධරයකු විසින් ම, ඔහු හෝ ඇය තොරතුරු නිලධරයකු ලෙස පත් කරනු ලැබ ඇත්තේ යම් පොදු අධිකාරියක් වෙනුවෙන් ද, ඒ අධිකාරිය වෙත ඉදිරිපත් කළ තොරතුරු සඳහා වන ඉල්ලීමක දී, ඒ තොරතුරු ලැබෙන්නට සැලැස්විය යුතු අතර, එවැනි ඉල්ලීමක් සිදු කරන යම් පුරවැසියකුට අවශ්‍ය සියලු සහාය ලබා දිය යුතු ය.

(3) තොරතුරු නිලධරයා විසින්, මෙම පනත යටතේ ඔහු හෝ ඇය වෙත පවරන ලද කාර්යය නිසි පරිදි ඉටු කිරීම සඳහා ඔහු හෝ ඇය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි වෙනත් යම් නිලධරයකුගේ සහාය ලබා ගත හැකි අතර, එසේ එවැනි නිලධරයකුගෙන් සහාය ඉල්ලා සිටි විට, එම සහාය ලබා දීම ඒ නිලධරයාගේ කාර්යය වන්නේ ය.

තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාපටිපාටිය.

**24.** (1) මේ පනත යටතේ තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කරන යම් පුරවැසියකු විසින්, ඉල්ලා සිටින තොරතුරු පිළිබඳ විස්තර නිශ්චිතව දක්වමින් උචිත තොරතුරු නිලධරයාට ලිඛිතව ඉල්ලීමක් කළ යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලබන යම් පුරවැසියකුට යම් හේතුවක් මත එම ඉල්ලීම ලිඛිතව කිරීමට නොහැකි අවස්ථාවක, එම ඉල්ලීම වාචිකව කිරීමට එම පුරවැසියාට හිමිකමක් ඇති අතර, ඉල්ලීම කරනු ලබන පුරවැසියා වෙනුවෙන් එම ඉල්ලීම ලිඛිතව සටහන් කර ගැනීම උචිත තොරතුරු නිලධරයාගේ කාර්යය වන්නේ ය.

(2) යම් පුරවැසියකු විසින් -

(අ) පොදු අධිකාරියක් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලබන අවස්ථාවක දී; හෝ

(ආ) මේ පනතේ නියමයන්ට අනුකූල නොවන ආකාරයට යම් පොදු අධිකාරියක් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී,

තොරතුරු නිලධරයා විසින් මේ පනතේ විධිවිධානවලට අනුකූලවන ආකාරයට එම ඉල්ලීම ඉදිරිපත් කිරීම සඳහා ගාස්තු අයකිරීමකින් තොරව එම පුරවැසියා වෙත සහාය ලබා දීමට අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය යුතු ය.

(3) ඉල්ලීමක් ලැබීමේ දී, එම ඉල්ලීම ඉදිරිපත් කළ පුරවැසියා වෙත තොරතුරු නිලධරයකු විසින් වහාම එම ඉල්ලීම ලැබීම පිළිබඳ ලිඛිත දැනුම්දීමක් යොමුකරනු ලැබිය යුතු ය.

(4) ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන යම් පුරවැසියකු වෙත කඩිනම් ප්‍රතිඋත්තරයක් ලබා දීමට යම් තොරතුරු නිලධරයකුට හැකිවේ නම්, සහ එම ප්‍රතිඋත්තරය මගින් ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබූ පුරවැසියා සෑහීමට පත්වේ නම්, එම ඉල්ලීම හා ඒ සඳහා ලබා දුන් ප්‍රතිඋත්තරය පිළිබඳ

තොරතුරු නිලධරයා විසින් වාර්තාවක් සකස් කර තබා ගත යුතු වේ.

(5) තොරතුරු සඳහා යම් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන පුරවැසියකු විසින්:-

(අ) තොරතුරු හඳුනාගැනීම සඳහා තොරතුරු නිලධරයා වෙත හැකියාව ලැබෙන පරිදි, සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි, ඉල්ලා සිටිනු ලබන තොරතුරුවලට අදාළ විස්තර සපයනු ලැබිය යුතු ය;

(ආ) එම පුරවැසියා තොරතුරුවලට ප්‍රවේශ වීමට අපේක්ෂා කරනු ලබන ආකෘතියේ ස්වභාවය හා භාෂාව හඳුනා ගනු ලැබිය යුතු ය;

(ඇ) යම් තැනැත්තකුගේ ජීවිතය ආරක්ෂා කර ගැනීම හෝ නිදහස ආරක්ෂා කර ගැනීම සඳහා තොරතුරු අවශ්‍ය බවට විශ්වාස කරනු ලබන අවස්ථාවක දී, එම විශ්වාස කිරීම පිළිබඳ පදනම ඇතුළුව ඒ සඳහා වූ ප්‍රකාශයක් ඇතුළත් කළ යුතු ය; සහ

(ඈ) ඔහු හෝ ඇය සම්බන්ධ කරගත හැකි අවශ්‍ය විස්තර හැර, තොරතුරු ඉල්ලා සිටීමට හේතු කිසිවක් හෝ වෙනත් පුද්ගලික විස්තර ලබා දීම අවශ්‍ය නොවන්නේ ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා -

"ලිඛිතව" යන්නට විද්‍යුත් මාර්ගයෙන් කරනු ලබන ලිඛිතව වූ කරුණු ද ඇතුළත් වේ; සහ

"උචිත තොරතුරු නිලධරයා" යන්නෙන් තොරතුරු ඉල්ලා සිටින පොදු අධිකාරියට පත් කරනු ලැබ සිටින තොරතුරු නිලධරයා අදහස් වේ.

24 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සඳහා තීරණය.

**25.** (1) තොරතුරු නිලධරයකු විසින්, හැකි ඉක්මණින් සහ කෙසේ වුව ද 24 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ලැබී වැඩ කරන දින දාහතරක් ඇතුළත 14 (ඉ) වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු උපලේඛනය ප්‍රකාරව නිශ්චය කරනු ලබන ගාස්තුවක් ගෙවීම මත ඉල්ලා සිටින ලද තොරතුරු සැපයීමට හෝ මේ පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති හේතුවලින් යම් එක් හේතුවක් හෝ ඊට වැඩි ගණනක් මත එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හෝ තීරණය කළ යුතු අතර, එම තීරණය, ඉල්ලීම කළ පුරවැසියා හට වහාම සන්නිවේදනය කළ යුතු ය.

(2) ඉල්ලා සිටින ලද තොරතුරු සැපයීම සඳහා තීරණයක් ගනු ලබන අවස්ථාවක, එම තොරතුරුවලට ප්‍රවේශ වීම, එම තීරණයට එළඹීමෙන් දින දාහතරක් ඇතුළත ප්‍රදානය කළ යුතු ය.

(3) තොරතුරු ලබාගැනීම සඳහා වන ඉල්ලීම, යම් පුරවැසියකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහස සම්බන්ධයෙන් වන අවස්ථාවක, එම ඉල්ලීම සඳහා ප්‍රතිචාර දැක්වීම, ඉල්ලීම ලැබීමෙන් පැය හතලිස් අටක් ඇතුළත කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ යම් ගාස්තුවක් ගෙවීමට ඇති අවශ්‍යතාවය නොතකා, ගාස්තුවක් ගෙවීමෙන් තොරව තොරතුරු නිලධරයකු විසින්

තොරතුරු සපයනු ලැබිය හැකි අවස්ථාවන් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(5) තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා ලබා දී ඇති (2) වන උපවගන්තියේ සඳහන් දින දාහතරක කාලසීමාව-

(අ) ඉල්ලීම කරනුයේ විශාල වාර්තා ප්‍රමාණයක් සඳහා වේ නම් සහ දින දාහතරක කාලසීමාවක් ඇතුළත තොරතුරු සැපයීම අදාළ පොදු අධිකාරියේ කටයුතු සමග අසාධාරණ ලෙස මැදිහත්වීමක් සිදුවේ නම්; හෝ

(ආ) ඉල්ලීම මගින් ඉල්ලා ඇති තොරතුරු ලබාගත යුතු පොදු අධිකාරියේ කාර්යාලය එම තොරතුරු නිලධරයාගේ මහා නගරයේ, නගරයේ නොවන හෝ වෙනත් ස්ථානයක පිහිටා ඇති විට, වාර්තා සොයා බැලීම හෝ එම කාර්යාලයෙන් වාර්තා ලබා ගැනීම තොරතුරු නිලධරයාට සාධාරණව දින දාහතරක් තුළ සම්පූර්ණ කළ නොහැකි අවස්ථාවක දී,

දින විසි එකකට වැඩි නොවන තවදුරටත් වූ කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තියේ සඳහන් යම් අවස්ථානුගත කරුණක් හේතුවෙන් තොරතුරු සැපයීමේ කාලසීමාව දීර්ඝ කිරීමට සිදුවන අවස්ථාවක දී, තොරතුරු නිලධරයා විසින්, හැකි සාධාරණ ඉක්මණින් සහ එහෙත් ඕනෑම අවස්ථාවක දී දින දාහතරක් ඇතුළත, අදාළ පුරවැසියා වෙත පහත සඳහන් කරුණු ඉදිරිපත් කරමින් එම කරුණ දැනුම් දිය යුතු වේ:-

(අ) දීර්ඝ කිරීමේ කාලසීමාව; සහ

(ආ) දීර්ඝ කිරීමේ හේතු.

(7) (6) වන උපවගන්තිය යටතේ ලබා දී ඇති හේතුවලින් අතෘප්තියට පත්වන යම් පුරවැසියකු විසින් නම් කළ නිලධරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

පොදු අධිකාරීන් විසින් තොරතුරු නිලධරයන් පිළිබඳ සහ අයකරනු ලබන ගාස්තු පිළිබඳ තොරතුරු ප්‍රදර්ශනය කළ යුතු බව.

**26.** (1) සෑම පොදු අධිකාරියක් විසින් ම පහත දැක්වෙන කරුණු නිශ්චිතව දක්වමින් කාර්යාල පරිශ්‍රය තුළ ප්‍රකටව පෙනෙන ස්ථානයක සහ එම පොදු අධිකාරියේ වෙබ් අඩවියක් ඇත්නම් එම වෙබ් අඩවියේ නිවේදනයක් ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය:-

(අ) කොමිෂන් සභාව හා සම්බන්ධ වීමේ විස්තර සහ කොමිෂන් සභාවේ සාමාජිකයන් පිළිබඳව;

(ආ) තොරතුරු නිලධරයාගේ සම්බන්ධ වීමේ විස්තර;

(ඇ) නම් කළ නිලධරයාගේ සම්බන්ධ වීමේ විස්තර; සහ

(ඈ) එම පොදු අධිකාරියෙන් ඕනෑම තොරතුරක් ලබා ගැනීම සඳහා අයකරනු ලබන ගාස්තු පිළිබඳව.

(2) (1) (ඈ) උපවගන්තියේ සඳහන් ගාස්තුව 14 (ඉ) වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් සකස්කර ඇති ගාස්තු උපලේඛනය ප්‍රකාරව නිශ්චය කරනු ලැබිය යුතු ය.

**27.** (1) තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීමකට ඉඩ දීමට තීරණයක් ගෙන ඇති අවස්ථාවක, එම තොරතුරු, ඉල්ලා සිටිනු ලබන ආකෘතියෙහි සැපයීම අදාළ ලේඛනයේ හෝ වාර්තාවේ සුරක්ෂිතභාවයට හෝ ආරක්ෂාවට අගතිදායක නොවන බව තොරතුරු නිලධරයාගේ මතය වන්නේ නම් මිස, එම තොරතුරු ඉල්ලා සිටින ලද ආකෘතියෙහි සපයනු ලැබිය යුතු ය.

තොරතුරු සපයන ආකාරය.

(2) ඉල්ලා සිටිනු ලබන ආකාරයට තොරතුරු සැපයීම සඳහා තොරතුරු නිලධරයකු අපොහොසත් වන අවස්ථාවක දී, තොරතුරු වෙත ප්‍රවේශ වීමේ උචිත විකල්ප ක්‍රමයක් තීරණය කිරීම සඳහා පුරවැසියාගෙන් උපදෙස් ලබා ගැනීම සහ හැකි සියලු සහාය එම පුරවැසියාට ලබාදීම මෙන්ම එම ඉල්ලීම ප්‍රකාරව ක්‍රියා කිරීම සඳහා පහසුකම් සැලැස්වීම එකී නිලධරයාගේ කාර්යය වන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, තොරතුරු ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමකට ඉඩ ලබා දී ඇත්තා වූ යම් පුරවැසියකු හට -

(අ) අදාළ වැඩ, ලේඛන, වාර්තා අධීක්ෂණය කිරීම සඳහා;

(ආ) අදාළ ලේඛනයෙන් හෝ වාර්තාවලින් සටහන්, උද්ධෘත හෝ සහතික පිටපත් ලබා ගැනීම සඳහා;

(ඇ) අදාළ ද්‍රව්‍යයන්ගේ සහතික කළ නිදර්ශන ලබා ගැනීම සඳහා;

(ඈ) එම තොරතුරු පරිගණකයක හෝ වෙනත් යම් උපාංගයක ගබඩා කර ඇති අවස්ථාවක දී, ඩිස්කට්, ප්ලොපි, පටි, දෘෂ්‍ය කැසට්පට හෝ වෙනත් යම් විද්‍යුත් ක්‍රමයකින් හෝ මුද්‍රිත පිටපත් වශයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා,

හිමිකමක් ඇත්තේ ය.

**28.** තොරතුරු නිලධරයකු විසින්, තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළ අවස්ථාවක දී, එම නිලධරයා විසින් එම ඉල්ලීම කළ පුරවැසියා වෙත 25 (1) වගන්තිය යටතේ යවනු ලැබීමට නියමිත සන්නිවේදනයේ පහත දැක්වෙන තොරතුරු නිශ්චිතව දන්වා යැවිය යුතු ය:-

ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ සන්නිවේදනය කිරීම.

(අ) එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු; සහ

(ආ) මෙම පනතේ 32 වන වගන්තිය යටතේ එම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අභියාචනයක් යොමු කළ හැක්කේ කවර කාලසීමාවක් ඇතුළත ද යන්න සහ එම අභියාචනය යොමු කළ හැක්කේ කවර තැනැත්තකු වෙත ද යන්න.

ඉල්ලා සිටින තොරතුරු තුන්වන පාර්ශවයක් විසින් සපයා ඇති අවස්ථාවක.

**29.** (1) යම් පුරවැසියකු විසින් තොරතුරු නිලධරයකුගෙන් ඉල්ලා ඇති තොරතුරු, තුන්වන පාර්ශවයකට අදාළ හෝ තුන්වන පාර්ශවයක් විසින් සපයන ලද අවස්ථාවක දී සහ එම තොරතුරු සපයනු ලබන අවස්ථාවේ දී එය රහසිගත තොරතුරක් වශයෙන් සලකනු ලැබූ අවස්ථාවක, තොරතුරු සැපයීමේ නිලධරයා විසින් එම ඉල්ලීම ලැබීමෙන් දින හතක් ඇතුළත දී, එම තොරතුරු හෙළිදරව් කිරීමට පක්ෂව හෝ විරුද්ධව එකී තුන්වන පාර්ශවය විසින් නිවේදන ලැබී දින හතක කාලයක් ඇතුළත නියෝජන ඉදිරිපත් කරන ලෙස ලිඛිත නිවේදනයක් නිකුත් කිරීම මගින් එකී තුන්වන පාර්ශවය වෙත ආරාධනා කරනු ලැබිය යුතු ය.

(2) තොරතුරු නිලධරයකු විසින්, තුන්වන පාර්ශවයකට අදාළ හෝ තුන්වන පාර්ශවයක් විසින් සපයා ඇති තොරතුරක් හෙළිදරව් කිරීම සඳහා වන ඉල්ලීමක් සම්බන්ධයෙන් තීරණයක් ගනු ලැබීමේ දී, (1) වන උපවගන්තිය යටතේ එම තුන්වන පාර්ශවය විසින් කරන ලද නියෝජනය සැලකිල්ලට ගත යුතු අතර, තුන්වන පාර්ශවය විසින් -

(අ) එම නිවේදනයට ප්‍රතිචාර දක්වනු නොලබන අවස්ථාවක දී, ඒ ඉල්ලා සිටිනු ලබන තොරතුරු හෙළිදරව් කළ යුතු ය;

(ආ) එම නිවේදනයට ප්‍රතිචාර දක්වා ඒ ඉල්ලා ඇති තොරතුරු හෙළිදරව් කිරීමට එකඟ වී ඇති අවස්ථාවක දී, එම තොරතුරු හෙළිදරව් කළ යුතු ය;

(ඇ) එම නිවේදනයට ප්‍රතිචාර දක්වා, ඒ ඉල්ලා ඇති තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, ඉල්ලා සිටිනු ලබන තොරතුරු වෙත ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, අදාළ තොරතුරු මුදා හැරීම, එම තොරතුරු හෙළිදරව් නොකිරීමේ පුද්ගලික බැඳියාවට, වඩා වැදගත්කමින් වැඩිවන අවස්ථාවක දී ඉල්ලීම කරනු ලබන පුරවැසියා විසින් තත්කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත, කොමිෂන් සභාව විසින්, තෙවන පාර්ශවයක් විසින් එම අනාවරණය කිරීමට එරෙහිව ඉදිරිපත් කරනු ලබන යම් විරෝධතා නොතකා ප්‍රශ්නගත තොරතුරු අනාවරණය කරන ලෙස විධාන කරනු ලැබිය හැකි ය.

සිවිල් හෝ අපරාධ නඩුකරවලට එරෙහිව ආරක්ෂාව.

**30.** මේ පනත යටතේ තොරතුරු නිලධරයකුට නියම කරනු ලැබූ හෝ පවරනු ලැබූ කර්තව්‍යයක් හෝ බලයක් ඉටු කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී, එම නිලධරයා සද්භාවයෙන් කරන ලද කවර වූ ක්‍රියාවක් හේතුකොටගෙන ඒ පොදු අධිකාරිය හෝ ඒ පොදු අධිකාරියේ තොරතුරු නිලධරයා හෝ වෙනත් යම් නිලධරයකු හෝ කිසිදු සිවිල් හෝ අපරාධ වගකීමකට යටත් නොවිය යුතු ය.

## VI වන කොටස
## ප්‍රතික්ෂේප කිරීම්වලට එරෙහි වූ අභියාචනා

**31.** (1) (අ) තොරතුරු ඉල්ලීම සඳහා කරන ලද යම් ඉල්ලීමක් භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම - ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමට එරෙහි අභියාචනා.

(ආ) 5 වන වගන්තිය යටතේ ප්‍රදානය කිරීමෙන් මුක්ත කර ඇති තොරතුරු හේතුවෙන් යම් තොරතුරක් වෙත ප්‍රවේශ වීම සඳහා අවස්ථාව ලබා දීම ප්‍රතික්ෂේප කිරීම;

(ඇ) මේ පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාලසීමාවන්ට අනුකූල නොවීම;

(ඈ) සම්පූර්ණ නොවූ, නොමග යවන හෝ සාවද්‍ය තොරතුරු ප්‍රදානය කිරීම;

(ඉ) වැඩිපුර ගාස්තු අයකිරීම;

(ඊ) ඉල්ලා සිටිනු ලබන ආකෘතියෙන් තොරතුරු සැපයීමට තොරතුරු නිලධරයා විසින් ප්‍රතික්ෂේප කිරීම;

(උ) එම තොරතුරු වෙත එම පුරවැසියා ප්‍රවේශවීම වැළැක්වීම සඳහා එම තොරතුරු විකෘතිකර, විනාශකර හෝ අස්ථානගතකර ඇති බවට එම තොරතුරු ඉල්ලා සිටිනු ලබන පුරවැසියා හට සාධාරණ හේතු පැවතීම,

මත අතෘප්තියට පත්වන යම් පුරවැසියකු විසින්, අවස්ථාවෝචිතපරිදි එම ප්‍රතික්ෂේප කිරීම, ක්‍රියාව හෝ අභියාචනයක් කිරීම සඳහා හේතු පවතින බව දැනගත් දින සිට දින දාහතරක කාලයක් ඇතුළත නම් කළ නිලධරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද අභියාචකට පාලනය කළ නොහැකි හේතුවක් නිසා අභියාචනය ගොනු කිරීමෙන් අභියාචක වළක්වා ඇති බවට නම් කළ නිලධරයා සෑහීමට පත් වේ නම් පමණක් දින දාහතරක කාලසීමාව අවසන්වීමෙන් පසුව ඔහු හෝ ඇය විසින් එම අභියාචනය පිළිගනු ලැබිය හැකි ය.

(2) නම් කළ නිලධරයා විසින්, ඕනෑම අවස්ථාවක දී, එසේ වුවත් වැඩකරන දින තුනක කාලයක් ඇතුළත, අභියාචනය කරනු ලබන පුරවැසියා වෙත එම අභියාචනය භාර ගැනීමේ දී, කුවිතාන්සියක් නිකුත් කළ යුතු ය.

(3) නම් කළ නිලධරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සඳහන් කර ඇති යම් අභියාචනයක් පිළිබඳ තීරණය, එම අභියාචනය ලැබී සති තුනක කාලයක් ඇතුළත ලබාදිය යුතු අතර, ඒ සඳහා වූ නිශ්චිත පදනම ඇතුළුව එම තීරණය සඳහා වූ හේතු ද දැක්විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා වූ යම් පුරවැසියකුගේ අයිතිවාසිකම, කොමිෂන් සභාව වෙත ඔහු හෝ ඇය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ අයිතිවාසිකමට අගතිගාමී නොවිය යුතු ය.

(5) අභියාචනය ඉදිරිපත් කරනු ලබන පුරවැසියා විසින් (1) වන උපවගන්තියේ සඳහන් කාලසීමාව ඇතුළත එම අභියාචනය ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම පිළිබඳ සාධාරණ හේතු ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, නම් කළ නිලධරයා විසින් ස්වකීය අභිමතය පරිදි එම ප්‍රමාදය නොසලකමින් අභියාචනය විභාග කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවට කරනු ලබන අභියාචන.

**32.** (1) (අ) 31(1) වගන්තිය යටතේ වන අභියාචනයක් සම්බන්ධයෙන් කරන ලද තීරණයෙන් අගතියට පත් යම් තැනැත්තකු විසින්, එම තීරණය සන්නිවේදනය කිරීමෙන් මාස දෙකක් ඇතුළත දී; හෝ

(ආ) 31 (3) වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති කාලය ඇතුළත තීරණයක් ලබා දිය යුතු යම් අභියාචනයකට තීරණය ලබා ගැනීමට නොහැකි වීමෙන් අගතියට පත් යම් තැනැත්තකු විසින්, එසේ නිශ්චිතව දක්වා ඇති කාලය ඉකුත් වීමෙන් මාස දෙකක් ඇතුළත දී,

එම තීරණයට හෝ තීරණය ලබා ගැනීමට නොහැකි වීමට එරෙහිව කොමිෂන් සභාවට අභියාචනා කළ හැකි අතර, කොමිෂන් සභාව විසින්, එම අභියාචනය ලැබීමෙන් දින තිහක් ඇතුළත අභියාචනා කොට ඇත්තේ කවර තීන්දුවකට එරෙහිව ද එම තීරණය ස්ථිර කිරීම, වෙනස් කිරීම, හෝ ප්‍රතිවර්තනය කිරීම කළ හැකි අතර, එම ඉල්ලීම අවශ්‍ය කටයුතු සඳහා අදාළ තොරතුරු නිලධරයාට නැවතත් යැවිය හැකි ය.

(2) අභියාචකට පාලනය කළ නොහැකි හේතුවක් නිසා නියමිත කාලයේ දී අභියාචන ගොනු කිරීමෙන් අභියාචක වළක්වා ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත්වේ නම්, එම මාස දෙකක කාලය අවසන් වීමෙන් පසුව කොමිෂන් සභාව විසින් අභියාචනය භාරගනු ලැබිය හැකිය.

(3) කොමිෂන් සභාව විසින් අභියාචක වෙත, තොරතුරු නිලධරයා වෙත සහ අදාළ අධිකාරිය වෙත ස්වකීය තීරණ සඳහා වූ හේතු ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) අභියාචනයක් ඉදිරිපත්කර ඇති අවස්ථාවක දී, ඉල්ලීමක් සකස් කිරීමේ දී පනතට එකඟව ක්‍රියාකර ඇති බව පෙන්වාදීම සඳහා වූ ඔප්පු කිරීමේ භාරය පොදු අධිකාරිය වෙත පැවරී ඇත්තේ ය.

අගතියට පත් පාර්ශවයක් වෙනුවෙන් අභියාචනය කළ හැකි බව.

**33.** අතෘප්තියට පත් පාර්ශවය විසින් අවසථාවොචි ත පරිදි, 31 වන වගන්තිය හෝ 32 වන වගන්තිය යටතේ යම් හේතුවක් මත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අගතියට පත් පාර්ශවය විසින් ලිඛිතව නිසි පරිදි බලය පවරනු ලබන වෙනත් යම් තැනැත්තකු මාර්ගයෙන් එම අභියාචනය යොමු කළ හැකි ය.

අභියාචනාධිකරණය වෙත අභියාචන ඉදිරිපත් කිරීම.

**34.** (1) 32 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් දෙන ලද තීරණයකින් අතෘප්තියට පත් යම් පුරවැසියකු හෝ පොදු අධිකාරියක් විසින්, ඒ තීරණයට එරෙහිව, එම තීරණය එකී පුරවැසියාට හෝ පොදු අධිකාරිය

වෙත දැනුම් දෙනු ලැබූ දිනයේ සිට මාසයක් ඇතුළත අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ යම් අභියාචනයකට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තෙක්, අභියාචනාධිකරණයට ප්‍රතිශෝධන මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමකට අදාළව එම ව්‍යවස්ථාව යටතේ සාදනු ලබන රීති, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම අභියාචනයක් සම්බන්ධයෙන් ම අදාළ කර ගනු ලැබිය යුතු ය.

## VII වන කොටස
## සාමාන්‍ය

**35.** යම් තැනැත්තන් කටු කවර හෝ ආකාරයකින්බලපාන තීරණයක් ලබා දෙන යම් පොදු අධිකාරියක සෑම නිලධරයකුම, අදාළ තැනැත්තා විසින් තත්කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක දී, එම තීරණයට එළඹීම සඳහා වූ හේතු එම තැනැත්තාට ලිඛිතව හෙළිදරව් කළ යුතු ය. *තීරණයක් සම්බන්ධයෙන් හේතු හෙළිදරව් කිරීමේ යුතුකම.*

**36.** මේ පනතේ කිසිවක් මගින්, නීතියට එකඟව යථා පරිදි ක්‍රියා කිරීමේ දී යම් තොරතුරු දරන්නන් විසින් තොරතුරු ප්‍රසිද්ධ කිරීමෙන් හෝ තොරතුරු වෙත ප්‍රවේශය ලබා දීමෙන් හෝ යම් තැනැත්තකු විසින් තොරතුරු සෙවීමෙන් සහ තොරතුරු ලබාගැනීමෙන්, වැළැක්වීමක් හෝ අධෛර්යමත් කිරීමක් සිදුවන බව අදහස් නොවිය යුතු ය. *මේ පනතේ කිසිවක් මගින් තොරතුරු ප්‍රසිද්ධ කිරීමෙන් අධෛර්යමත් කිරීම හෝ වැළැක්වීමක් සිදු නොවන බව.*

**37.** (1) අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකන පරිදි නොයෙක් විට, එහෙත් එක් ලිත් වර්ෂයකට යටත් පිරිසෙයින් එක් වාර්තාවක් පිළියෙල වන සේ, කොමිෂන් සභාව විසින් එහි කටයුතු පිළිබඳ වාර්තා පිළියෙල කළ යුතු ය. එසේ පිළියෙල කරනු ලබන සෑම වාර්තාවක ම පිටපතක් කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට පාර්ලිමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු අතර, එක් එක් වාර්තාවේ පිටපතක් ජනාධිපතිවරයාට ද යැවිය යුතු ය. *කොමිෂන් සභාව විසින් ස්වකීය කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කළ යුතු බව.*

(2) (1) වන උපවගන්තිය යටතේ සකස් කරන ලද වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් සති දෙකක් ඇතුළත දී, කොමිෂන් සභා කාර්යාලයේ දී මහජන පරීක්ෂාව සඳහා තැබීමට සැලැස්විය යුතු අතර, හැකි සෑම අවස්ථාවක දී ම එහි පිටපතක් කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් ලබා ගැනීමට සැලැස්විය යුතු ය.

**38.** (1) (අ) යම් තොරතුරු නිලධරයකු විසින් සිතාමතාම - *කොමිෂන් සභාව විසින් නිසි විනය බලධරයා වෙත දැනුම්දීම.*

(i) යම් පුරවැසියකුගේ තොරතුරු ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමක් ලබා ගැනීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී;

(ii) ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ හේතු දැන්වීමකින් තොරව තොරතුරු සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී;

(iii) 14 (ඉ) වගන්තියේ ගාස්තු උපලේඛනය උල්ලංඝනය කරමින් ඉහළ ගාස්තු නිර්දිෂ්ට කරනු ලබන අවස්ථාවක දී;

(iv) මෙම පනතේ විධිවිධානවලට අනුකූලව ඉල්ලීමක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී; හෝ

(ආ) යම් නම් කළ නිලධරයකු විසින් සිතාමතාම -

(i) මේ පනතේ 5 වන වගන්තියේ සඳහන් හේතුවක් මත හැර, වෙනත් යම් හේතුවක් නිසා 31 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී; හෝ

(ii) 31 (3) වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත, සිදුකරන ලද අභියාචනයක් පිළිබඳ තීරණයක් ලබා දීමට කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හැරීම සිදුකරනු ලබන අවස්ථාවක දී,

කොමිෂන් සභාව විසින් එම කරුණ පිළිබඳව නිසි විනය බලධරයාගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(2) අදාළ විනය බලධරයා විසින් එම අධිකාරිය වෙත යොමු කරන ලද යම් කරුණක් සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව මාසයක කාලයක් ඇතුළත කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතු ය.

වැරදි

**39.** (1) (අ) තොරතුරු සැපයීම සිතාමතා අවහිර කරනු ලබන හෝ චේතනාන්විතව වැරදි සහගත, අසම්පූර්ණ හෝ නිවැරදි නොවන තොරතුරු සපයනු ලබන;

(ආ) එම පොදු අධිකාරියේ ඔහු හෝ ඇයගේ සේවා නියුක්තිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ලබා ගත් දැනුම හෝ තමා වෙත ප්‍රවේශයක් ඇති, තොරතුරු චේතනාන්විතව විනාශ කරනු ලබන, අවලංගු කරනු ලබන, වෙනස් කරනු ලබන හෝ පූර්ණ හෝ අර්ධ වශයෙන් වසන් කරනු ලබන; හෝ

(ඇ) කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටීමේ දී කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම පැහැර හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරනු ලබන;

(ඈ) කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිට කොමිෂන් සභාව විසින් කරනු ලබන පරීක්ෂණ පැහැර හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරනු ලබන හෝ ඔහුගේ භුක්තියේ හෝ බලය යටතේ පවතින යම් තොරතුරු ඉදිරිපත් කිරීම පැහැර හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරනු ලබන හෝ දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම යටතේ චේතනාන්විතව සාවද්‍ය තොරතුරු සපයනු ලබන;

(ඉ) කොමිෂන් සභාවේ තීරණයකට අනුකූලවීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන;

(ඊ) මේ පනත මගින් කොමිෂන් සභාව වෙත පැවරී ඇති හෝ එම කොමිෂන් සභාවේ යම් නිලධරයකු හෝ සේවානියුක්තිකයකු වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කොමිෂන් සභාව හෝ එහි යම් නිලධරයකු හෝ සේවානියුක්තිකයකු වළක්වන හෝ අවහිර කරනු ලබන;

(උ) මෙම පනතේ 12 (7) වගන්තියේ විධිවිධාන උල්ලංඝනය වන ආකාරයට යම් තොරතුරක් හෙළිකරනු ලබන,

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩ මුදලකට හෝ අවුරුදු දෙකක කාලයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම එම තැනැත්තා යටත් විය යුතු ය.

(2) 23 (3) වගන්තිය යටතේ තොරතුරු නිලධරයකු විසින් සහාය ඉල්ලා සිටියේ යම් නිලධරයකුගෙන් ද ඒ නිලධරයා විසින් සාධාරණ හේතුවක් නොමැතිව ඒ සහාය ලබා දීම පැහැර හරින විට, ඒ නිලධරයා මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයා විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන හෝ (2) වන උපවගන්තිවල සඳහන් කරන ලද යම් වරදක් සිදු කිරීම වෙනුවෙන් පනවන ලද දඩය, මේ පනත යටතේ පනවන ලද කාර්යයක් කරගෙන යාම පැහැර හැරීම වෙනුවෙන්, විනය ක්‍රියා මාර්ග යක් ගැනීමට බලය පවරා ඇති අදාළ අධිකාරිය විසින් ඒ නිලධරයාට එරෙහිව ගනු ලැබිය හැකි යම් විනය ක්‍රියා මාර්ගයකට හානියක් නොවන අමතර දඩයක් විය යුතු ය.

(4) මෙම පනත යටතේ අපරාධ නඩු පැවරීමක් කොමිෂන් සභාව විසින් ආරම්භ කළ යුතු ය.

**40.** යම් පොදු අධිකාරියක කිසිදු නිලධරයකු හෝ සේවා නියුක්තිකයකු වීම හේතුවෙන්, යම් නීතිමය හෝ වෙනත් බැඳීමකට යටත් වන යම් තැනැත්තකු, එම නීතිමය හෝ බැඳීම කුමක් වුවත් මේ පනත යටතේ නිදහස් කිරීමට හෝ හෙළිදරව් කිරීමට අවසර දෙනු ලබන යම් තොරතුරු, නිදහස් කිරීම හෝ හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් විනයානුකූල හෝ අන්‍යාකාර වූ යම් දඬුවමකට යටත් නොවිය යුතු ය.

පොදු අධිකාරියක නිලධරයකු විසින් තොරතුරු නිදහස් කිරීම හෝ හෙළිදරව් කිරීම.

**41.** (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව විමසා මේ පනත යටතේ නියම කිරීම අවශ්‍ය වන සියලු කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනතේ මූලධර්ම සහ විධිවිධාන බලාත්මක කිරීම සඳහා නියෝග සෑදීමට අවශ්‍ය විය හැකි සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

නියෝග.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ නියෝග එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ ඒ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කළ පසු නොපමාව අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර, එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කළ සේ සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

රීති.

**42.** (1) කොමිෂන් සභාව විසින් පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි යː-

(අ) කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු ආකෘතිය සහ ආකාරය;

(ආ) පරීක්ෂණයක් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;

(ඇ) තොරතුරු සැපයීම සම්බන්ධයෙන් වූ ගාස්තු උපලේඛනය;

(ඈ) 10 වන වගන්තිය යටතේ සකස් කළ යුතු වාර්තාවල ආකෘතිය.

(2) මේ වගන්තිය යටතේ සාදන ලද කිසිදු රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කර, ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

අර්ථ නිරූපණය.

**43.** මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වවු හොත් මිස-

"පුරවැසියා" යන්නට, යම් ව්‍යවස්ථාපිත වූ හෝ ව්‍යවස්ථාපිත නොවූ මණ්ඩලයක සාමාජිකයන්ගෙන් හතරෙන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් පුරවැසියන් වන්නේ නම්, එවැනි මණ්ඩලයක් ඇතුළත් වේ;

"නම් කළ නිලධරයා" යන්නෙන්, මෙම පනතේ 23 වන වගන්තිය යටතේ පත් කරනු ලැබ ඇති අභියාචන විභාග කිරීමේ නිලධරයකු අදහස් වේ;

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත මගින් පිහිටුවන ලද හෝ පිහිටුවන ලදැයි සලකන හෝ ඇති කරන ලද හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ හෝ වෙනත් යම් පනතක විධිවිධාන යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක්, මණ්ඩපයක් හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් අදහස් වේ;

"තොරතුරු" යන්නට, පහත සඳහන් ඒවායේ භෞතික ස්වරූපය හෝ ස්වභාවය නොසලකා, සටහන්, ලේඛන, සංදේශ, විද්‍යුත් තැපැල්, මත, උපදේශ, මාධ්‍ය නිවේදන, චක්‍රලේඛ, නියම, ලොග් පොත්, ගිවිසුම්, වාර්තා, ප්‍රවෘත්ති පත්‍ර, සාම්පල්, ආදර්ශක, හුවමාරු වන ලිපි, සංදේශ, නීති කෙටුම්පත්, පොත්, පිඹුරු, සිතියම්, චිත්‍ර, රූපසටහන්, රූපමය හෝ ප්‍රස්තාරමය වැඩ හෝ ඡායාරූප, සේයාපට, ක්ෂුද්‍ර සේයාපට, ශබ්ද පටිගත කිරීම්, වීඩියෝ පට, යන්ත්‍ර මගින් කියවිය හැකි වාර්තා, පරිගණක වාර්තා සහ වෙනත් ලේඛනගත ද්‍රව්‍ය, ඇතුළු යම් ආකාරයකින් ලේඛනගත කරන ද්‍රව්‍ය සහ ඒවායේ යම් පිටපත් ඇතුළත් වේ;

"තොරතුරු නිලධරයා" යන්නෙන්, මේ පනතේ 23 වන වගන්තිය යටතේ පත් කරනු ලබන තොරතුරු සපයන නිලධරයකු අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහා නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් මගින් ක්‍රියාත්මක කරනු ලබන, කරනු ලබන සහ ඉටු කරනු ලබන බලතල, කාර්ය සහ කර්තව්‍යවලට අනුරූපී හෝ සමාන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා යම් නීතියක් යටතේ ඇති කරනු ලබන හෝ පිහිටුවනු ලබන යම් අධිකාරියක් ද අදහස් වේ;

"රාජ්‍ය නොවන සංවිධාන" යන්නෙන්, ස්වේච්ඡා පදනම මත පුද්ගල කණ්ඩායමක් විසින් ඇතිකරන ලද, රජයෙන් හෝ ජාත්‍යන්තර සංවිධානවලින් සෘජුව හෝ වක්‍රව අරමුදල් ලැබෙන, රාජ්‍ය නොවන ආකාරයේ සංවිධාන අදහස් වේ;

"පොදු අධිකාරිය" යන්නෙන් -

(අ) ආණ්ඩුවේ අමාත්‍යාංශයක්;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ (ඉ) ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට හැර 2007 අංක 7 දරන සමාගම් පනත හැර යම් ලිඛිත නීතියක්, හෝ පළාත් සභාවක ප්‍රඥප්තියක් මගින් හෝ යටතේ පිහිටුවන ලද යම් මණ්ඩලයක් හෝ කාර්යාලයක්;

(ඇ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්;

(ඈ) රාජ්‍ය සංස්ථාවක්;

(ඉ) සිය කොටස්වලින් සියයට විසිපහක් හෝ ඉන් වැඩි ප්‍රමාණයක් හෝ අන්‍යාකාරයකින් පාලන අයිතියක් ඇති රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ රජය සහ රාජ්‍ය සංස්ථාවක් එකතුව දරනු ලබන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක්;

(ඊ) පළාත් පාලන ආයතනයක්;

(උ) ආණ්ඩුව හෝ එහි නියෝජ්‍යායතනයක හෝ පළාත් පාලන ආයතනයක කොන්ත්‍රාත්තුවක්, හවුල් ව්‍යාපාරයක්, ගිවිසුමක් හෝ බලපත්‍රයක් යටතේ ව්‍යවස්ථාපිත හෝ පොදු කර්තව්‍යයක් ඉටුකරන එහෙත් ඒ ව්‍යවස්ථාපිත හෝ පොදු කර්තව්‍යයන්ගෙන් හෝ පොදු සේවාවන්ගෙන් ආවරණය වූ ක්‍රියාකාරකම් ප්‍රමාණයකට පමණක් සීමා වූ පෞද්ගලික හිමිකාරීත්වයක් හෝ සංවිධානයක්;

(ඉඉ) පළාත් සභාවක් විසින් පිහිටුවන ලද හෝ ඇති කරන ලද යම් දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් අධිකාරියක් හෝ ආයතනයක්;

(එ) මහජනතාව වෙත සේවයක් ලබාදෙනු ලබන සහ ඉල්ලා සිටින ලද තොරතුරු මහජනතාව වෙත ලබාදෙනු ලබන සේවයට අදාළ වනතාක් දුරට ආණ්ඩුව හෝ යම් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභාවක් මගින් පිහිටුවන ලද හෝ ඇතිකරන ලද වෙනත් අධිකාරියක් හෝ විදේශීය ආණ්ඩුවක් හෝ ජාත්‍යන්තර සංවිධානයක් මගින් සැලකිය යුතු ප්‍රමාණයේ අරමුදල් සපයනු ලබන රාජ්‍ය නොවන සංවිධාන;

(ඒ) යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලබන, හඳුනාගනු ලබන හෝ බලපත්‍රයක් ලබා දෙනු ලබන හෝ රජය මගින් හෝ රාජ්‍ය සංස්ථාවක් මගින් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලබන හා ඇති කරනු ලබන යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මගින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මූල්‍යාධාර සපයන පෞද්ගලික විශ්වවිද්‍යාල සහ වෘත්තීය ආයතන ඇතුළු උසස් අධ්‍යාපන ආයතන;

(ඔ) යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලබන, පිළිගනු ලබන හෝ බලපත්‍රයක් ලබා දෙනු ලබන හෝ රජය මගින් හෝ රාජ්‍ය සංස්ථාවක් මගින් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලබන හා ඇති කරනු ලබන යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මගින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මූල්‍යාධාර සපයන වෘත්තීය හෝ කාර්මික අධ්‍යාපනය ලබා දෙන ආයතන ඇතුළු පුද්ගලික අධ්‍යාපන ආයතන;

(ඕ) යුක්තිය පසිඳලීම සඳහා ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකරණ හා ආයතන,

අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**44.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## උපලේඛනය

12 (8) වන වගන්තිය

කොමිෂන් සභාවේ සාමාජිකයන්ට අදාළ වන විධිවිධාන

(1) කොමිෂන් සභාවේ සාමාජිකයකු -

(අ) ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියකින් ඔහුගේ හෝ ඇයගේ ධුරයෙන් කලින් ඉල්ලා අස්වූ අවස්ථාවක දී;

(ආ) ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරන අවස්ථාවක දී;

(ඇ) අධිකරණය විසින් වරදකරුවකු කරනු ලැබ ඇති අවස්ථාවක දී;

(ඈ) කොමිෂන් සභාවෙන් කලින් නිවාඩු ලබා ගැනීමකින් තොරව කොමිෂන් සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට ඔහු හෝ ඇය නොපැමිණ සිටීමෙන් ධුරය හැරගියා සේ සලකන අවස්ථාවක දී; හෝ

(ඉ) ධුරය දරන කාල සීමාව තුළදී ඔහුගේ ධුරයේ කාර්යට පරිබාහිරව යම් රැකියාවක නිරත වන අවස්ථාවක දී,

ඔහුගේ සාමාජිකත්වය අවසන් විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ සාමාජිකයකු -

(අ) යම් කායික දුබලතාවයක් හෝ සිහිවිකලභාවයක් හේතුවෙන් ඔහුගේ හෝ ඇයගේ කාර්යයන් ඉටු කිරීමට ස්ථිර වශයෙන් නොහැකි අවස්ථාවක දී;

(ආ) චරිත දූෂණය මත ඔහු හෝ ඇයගේ රාජකාරි ඉටුකිරීමට සුදුසු තත්වයක නොමැති අවස්ථාවක දී; හෝ

(ඇ) නිසි බලය ඇති අධිකරණයක් විසින් යම් වරදකට වරදකරු කර ඇති අවස්ථාවක දී,

ඒ සාමාජිකයා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විමසා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ වෙනත් යම් සාමාජිකයකු විසින් ජනාධිපතිවරයා අමතා තත්කාර්ය සඳහා යවනු ලබන ලිපියක් මගින් ඒ ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලිඛිතව පිළිගන්නා දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(4) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුගේ ධුරය හිස්වන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් 12 (1) වගන්තියේ සඳහන් කාර්ය පටිපාටිය අනුගමනය කළ යුතු අතර, වෙනත් තැනැත්තකු ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරීමට පත්කරනු ලැබිය යුතු ය.

(5) (අ) කොමිෂන් සභාවේ සාමාජිකයකු අසනීපයක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ඔහුගේ හෝ ඇයගේ කාර්යයන් ඉටු කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ඒ සාමාජිකයා වෙනුවට ක්‍රියාකිරීමට ඔහු හෝ ඇය නොපැමිණි කාලය සඳහා වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය හැකි ය;

(ආ) කොමිෂන් සභාවේ සභාපතිවරයා අසනීපයක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ඔහුගේ හෝ ඇයගේ කාර්යයන් ඉටු කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් ඒ සභාපතිවරයා නැති විට, සභාපතිවරයා වෙනුවෙන් ක්‍රියාකිරීමට කොමිෂන් සභාවේ වෙනත් යම් සාමාජිකයකු පත්කරනු ලැබිය යුතු ය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකයන්ට මුදල් විෂයයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු පරිදි යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය යුතු ය.

(7) (අ) කොමිෂන් සභාව සෑම මසක දී ම යටත් පිරිසෙයින් එක් වරක් හෝ අවශ්‍ය පරිදි වාර ගණනක් රැස්විය යුතු ය.

(ආ) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තුන් දෙනෙකු විය යුතු ය.

(ඇ) කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මුලසුන කොමිෂන් සභාවේ සභාපතිවරයා දැරිය යුතු අතර, එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා ගත යුතු ය.

(ඈ) කොමිෂන් සභාවේ යම් රැස්වීමක දී සභාපතිවරයාට හෝ මුලසුන දරන යම් තැනැත්තකුට තමාගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් හිමි විය යුතු ය.

(ඉ) කොමිෂන් සභාව විසින් එහි රැස්වීම් පැවැත්වීම සහ රැස්වීමේ කටයුතු සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය යුතු ය.

(8) කොමිෂන් සභාවේ මුද්‍රාව -

(අ) කොමිෂන් සභාව විසින් කලින් කලට නිශ්චය කරනු ලබන ආකාරයට විය යුතු ය;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය;

(ඇ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ඈ) කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ වෙනත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඒ දෙදෙනා විසින් තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් එකී සාධන පත්‍රයෙහි අත්සන් කළ යුතු ය.

The RTI Act enacted in August 2016 empowers citizens to call for transparency and accountability of the State which exercises the sovereign powers of the People, and public authorities including private entities which have an impact on public life. This increases the proactive and meaningful participation of citizens in public life, which is an essential element of democracy.

This Manual provides the RTI Act in a simplified form for citizens to be able to fully comprehend the contents of the Act and utilize its provisions to make the Government more accountable to the People.

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
இலங்கை பத்திரிகை ஸ்தாபனம்
Sri Lanka Press Institute

The Sri Lanka Press Institute (SLPI)
96, Kirula Road, Colombo – 05, Sri Lanka.
T : +94-11-5353635 Fax: +94-11-5335500
E : info@slpi.lk W: www.slpi.lk

9 789551 734084